# ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න සහ ඒවා විසඳාගන්නා විකල්ප ක්‍රම

**2012 A/L**

## 01. සම්පත් වල හිඟකමක් පවත්නා බැවින්,

(1) සෑම සමාජයක්ම මධ්‍යගත සැලසුම්කරණය ක්‍රියාවට නැංවිය යුතුය.

(2) පවත්නා සම්පත් විවිධ භාවිතයන් අතර බෙදා වෙන් කළ යුතු ආකාරය ආණ්ඩුව විසින් තීරණය කළ යුතුය.

(3) සෑම සමාජයකම කිසියම් සාමාජික පිරිසක් දිළින්දන් වශයෙන් ජීවත් විය යුතුය.

(4) සෑම සමාජයක්ම පවත්නා සම්පත්වල විකල්ප භාවිත අතර තේරීමක් කළ යුතුය.

(5) සමාජයේ සම්පත් ප්‍රමාණය ඒවා යොදා ගත හැකි භාවිතයන්ගේ ප්‍රමාණයට වඩා වැඩි වනු ඇත.

# ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න සහ ඒවා විසඳාගන්නා විකල්ප ක්‍රම

**2012 A/L**

**02. පහත සඳහන් දෑ අතුරෙන් නිෂ්පාදන හැකියා වක්‍රයක් පිටතට විතැන්වීම කෙරෙහි බලනොපාන කරුණ වනුයේ,**

(1) තාක්ෂණය දියුණු වීමය.

(2) වඩාත් විවෘත ප්‍රවේශයකින් අබාධ වෙළෙඳාම කරා නැඹුරු වීමය.

(3) විරැකියාව පහළ වැටීමය.

(4) ජනගහනයේ අධ්‍යාපන මට්ටම් ඉහළ යාමය.

(5) ඵලදායීතාව ඉහළ යාමය.

# ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න සහ ඒවා විසඳාගන්නා විකල්ප ක්‍රම

**2012 A/L**

**03. සියලුම නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගනු ලබන සම්පත් එකිනෙකට පූර්ණ ආදේශක වුවහොත් පහත සඳහන් කවර ප්‍රකාශයක් නිවැරදි වේ ද?**

(1) සියලු ම භාණ්ඩවල නිමැවුම ආවස්ථික පිරිවැයකින් තොර ව ඉහළ නැංවිය හැකිය.

(2) නිෂ්පාදන හැකියා වක්‍රය සරල රේඛාවක් වනු ඇත.

(3) විශේෂීකරණය සහ අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකාට වාසි ගෙන දෙන වෙළෙඳාමක් හට ගැනීමට කිසිදු ඉඩක් නොමැත.

(4) කවර හෝ නිෂ්පාදන කටයුත්තක් සම්බන්ධයෙන් කිසිදු රටකට හෝ කිසිදු පුද්ගලයෙකුට හෝ සාපේක්ෂ වාසියක් ඇති නොවේ.

(5) සම්පත් පිළිබඳ හිඟකම මුළුමනින් ම පහව යනු ඇත.

# ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න සහ ඒවා විසඳාගන්නා විකල්ප ක්‍රම

## 2012 A/L

**04. පහත සඳහන් ඒවා අතුරෙන් සූක්ෂම ආර්ථික විද්‍යාත්මක මාතෘකාවක් වනුයේ කවරක් ද?**

(1) පොලී අනුපාතිකයන් පොදුවේ ඉහළ යාම.

(2) උද්ධමන අනුපාතිකය පහළ වැටීම .

(3) ඇමරිකා එක්සත් ජනපදයේ දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම.

(4) ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතිකය පහළ වැටීම.

(5) කිරිපිටි මිල ඉහළ යාම.

# ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න සහ ඒවා විසඳාගන්නා විකල්ප ක්‍රම

**2012 A/L**

**05. පහත සඳහන් දෑ අතුරෙන් නොමිල භාණ්ඩයක (a free good) ලක්ෂණයක් වන්නේ කවරෙක්ද?**

(1) එබදු භාණ්ඩයක් සැපයීමේ දී ආවස්ථික පිරිවැයක් ඇති නොවීම.

(2) එබදු භාණ්ඩයක පරිභෝජනය සමාජයීය වශයෙන් හිතකර වේ යැයි සලකනු ලබන බැවින්, ඒවා සාමාන්‍යයෙන් රජය විසින් සැපයීම .

(3) එබදු භාණ්ඩයක පරිභෝජනය හෝ නිෂ්පාදනය හෝ බාහිරතා බිහි නො කිරීම.

(4) එබදු භාණ්ඩයක සැපයුම පූර්ණ වශයෙන් අනම්‍ය වීම.

(5) එබදු භාණ්ඩයක නිෂ්පාදනය හීනවන ඵලදා නීතියට යටත් වීම.

# ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න සහ ඒවා විසඳාගන්නා විකල්ප ක්‍රම

**2012 A/L**

**06. නිදහස් වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක මූලික අංගයක් වනුයේ,**

(1) ආණ්ඩුවේ මැදිහත් වීම ඉතා ඉහළ මට්ටමක තිබීම.

(2) සම්පත් පිළිබඳ පොදු හිමිකාරීත්වයයි.

(3) පෞද්ගලික දේපොල ක්‍රමයයි.

(4) මධ්‍යගත සැලසුම් අධිකාරීන් විසින් වැටුප් සහ මිල තීරණය කිරීමය.

(5) අවශ්‍ය කරන කුසලතා සහිත සේවකයන් බඳවා ගැනීමේ දී සේව්‍ය පක්ෂය විසින් රාජ්‍ය ආයතනවලින් උපදෙස් ලබා ගැනීමය.

# ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න සහ ඒවා විසඳාගන්නා විකල්ප ක්‍රම

**2013 A/L**

**01. පහත සඳහන් දෑ අතුරෙන් අභිමතානුරූපී ප්‍රකාශයක් වනුයේ කවරක් ද?**

(1) ආර්ථික විද්‍යාඥයෝ ස්වාභාවික සම්පත් ප්‍රතිෂ්ඨාපනය කළ හැකි හා ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි වශයෙන් වර්ග කරයි.

(2) පරිසරය හිඟ සම්පතකට උදාහරණයක් වේ.

(3) අසීමිත වුවමනා සපුරාලීම සඳහා ආර්ථිකයක් සතුව ඇත්තේ සීමිත සම්පත් ප්‍රමාණයකි.

(4) වර්තමානයේ ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය අංක එකේ සංඛ්‍යාවකි.

(5) ආදායම අසමාන ලෙස බෙදීයාම අසාධාරණ වේ.

# ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න සහ ඒවා විසඳාගන්නා විකල්ප ක්‍රම

**2013 A/L**

**02. පූර්ණ සේවා නියුක්තිය පවතින ආර්ථිකයක ප්‍රාග්ධන ආයෝජනය ඉහළ නැංවීමේ ආවස්ථික පිරිවැය වනුයේ**

**(1)** පරිභෝජනය පහළ වැටීම ය.

**(2)** ආදායම පහළ වැටීම ය.

**(3)** ඉතුරුම් ඉහළ නැගීම ය.

**(4)** පොලී අනුපාතිකය ඉහළ නැගීම ය.

**(5)** නිමැවුම පහළ වැටීම ය.

# ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න සහ ඒවා විසඳාගන්නා විකල්ප ක්‍රම

**2013 A/L**

**03. පරිවර්තන ආර්ථිකය යන සංකල්පයෙන් විස්තර කෙරෙනුයේ,**

(1) ශ්‍රම සුක්ෂ්ම නිෂ්පාදන ක්‍රමශිල්ප වෙනුවට ප්‍රාග්ධන සුක්ෂ්ම නිෂ්පාදන ක්‍රම ශිල්ප යොදා ගන්නා රටකි.

(2) මධ්‍යගත සැලසුම් ආර්ථිකයක සිට වෙළෙඳපොළ ආර්ථිකයක් කරා නැඹුරු වන රටකි.

(3) අඩු ආදායම සහිත ආර්ථිකයක සිට මධ්‍යම ආදායම් සහිත ආර්ථිකයක් කරා නැඹුරු වන රටකි.

(4) වෙළෙඳ ශේෂයේ හිඟයක් සහිත තත්ත්වයක සිට වෙළෙඳ ශේෂයේ අතිරික්තයක් සහිත තත්ත්වයකට පත්වන රටකි.

(5) සාම්ප්‍රදායික ආර්ථිකයක සිට මධ්‍යගත සැලසුම් ආර්ථිකයක් කරා නැඹුරු වන රටකි.

# ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න සහ ඒවා විසඳාගන්නා විකල්ප ක්‍රම

**2013 A/L**

**04. මධ්‍යගත සැලසුම් ආර්ථිකයක දැකිය හැකි වැදගත් ලක්ෂණයක් වනුයේ**

(1) සාපේක්ෂ මිල ගණන් පදනම කර ගනිමින් සම්පත් බෙදී යාම ය.

(2) ආර්ථික වෘද්ධියට බලපාන ප්‍රබල සාධකයක් ලෙස සම්පත් පිළිබඳ පෞද්ගලික හිමිකාරිත්වය පැවතීම ය.

(3) භාණ්ඩ හා සේවා වඩාත් හොඳින් නිෂ්පාදනය කළ හැකි ආකාරය පිළිබඳ තීරණ ආණ්ඩුවේ සැලසුම සම්පාදනයන් විසින් ගැනීම ය.


(4) වෙළෙඳ පොළ ආර්ථික පද්ධතියක පවතිනවාට වඩා ඉහළ මට්ටමේ කාර්යක්ෂමතාවක් අත්කර ගැනීම ය.

(5) ආදායම හා ධනය ඉතා අසමාන ආකාරයට බෙදී යාම ය.

# ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න සහ ඒවා විසඳාගන්නා විකල්ප ක්‍රම

**2013 A/L**

**05. X හා Y රටවල් දෙකට අදාළ නිෂ්පාදන හැකියා වක්‍ර පහත සඳහන් රූපසටහන පෙන්නුම් කරයි.**



# ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න සහ ඒවා විසඳාගන්නා විකල්ප ක්‍රම

**2013 A/L**

**මෙම රටවල් දෙක සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ කවරක් ද?**

**(1)** රටවල් දෙකේ ම එක හා සමාන වූ ආවස්ථික පිරිවැයක් හැමවිට ම පවතී.

**(2)** රටවල් දෙකේ ම අනාගත වෘද්ධි අපේක්ෂා එක සමාන වේ.

**(3)** රටවල් දෙකේ ම ආවස්ථික පිරිවැය වැඩි වෙමින් පවතී.

**(4)** රටවල් දෙකේ ම එක සමාන වූ භාණ්ඩ සංයෝජනයක් කිසිවිටකත් නිපදවිය නොහැකි ය.

**(5)** පරිභෝජන භාණ්ඩ නිෂ්පාදනයේ දී X රටේ ආවස්ථික පිරිවැය Y රටේ ආවස්ථික පිරිවැයට වඩා වැඩි ය.

## 2014 A/L

**01. ආර්ථික විද්‍යාවේ දී හදාරනු ලබන්නේ,**

(1) සම්පත් හිඟකම හා පූර්ණ සේවා නියුක්තිය පිළිබඳව ය.

(2) සම්පත් හිඟකම හා නිෂ්පාදන පිළිබඳව ය.

(3) සම්පත් හිඟකම හා තෝරාගැනීම පිළිබඳව ය.

(4) සම්පත් හිඟකම හා කාර්යක්ෂමතාව පිළිබඳව ය.

(5) සම්පත් හිඟකම හා ආදේශකතාව පිළිබඳව ය.

**2014 A/L**

**02. ආර්ථික විද්‍යාවේ දී ආවස්ථික පිරිවැය වශයෙන් නිර්වචනය කරන්නේ,**

(1) යමක් ලබා ගැනීම වෙනුවෙන් කැප කළ අනෙකුත් අවස්ථායි.

(2) යමක් ලබා ගැනීම සඳහා වැය වූ මූල්‍ය පිරිවැයයි.

(3) යමක් ලබා ගැනීම සඳහා ගත වූ කාලයේ පිරිවැයයි.

(4) යමක් ලබා ගැනීම සඳහා වැය වූ ස්ථාවර හා විචල්‍ය පිරිවැයේ එකතුවයි.

(5) යමක් ලබා ගැනීම වෙනුවෙන් අත්හරින ලද හොඳම විකල්පයේ වටිනාකමයි.

**2014 A/L**

**03. පහත දැක්වෙන දෑ අතුරෙන් ආර්ථික භාණ්ඩයක ලක්ෂණ නිවැරදි ව පිළිබිඹු කරන පිළිතුර තෝරන්න.**

A - නිෂ්පාදන පිරිවැයක් පැවතීම

B - ආවස්ථික පිරිවැයක් පැවතීම

C - පාරිභෝගිකයා විසින් වියදමක් දැරීම

D - අඩුවන ආන්තික පිරිවැයක් පැවතීම

(1) A සහ B ය

(2) A සහ C ය

(3) A, B, සහ C ය

(4) A, C සහ D ය

(5) B, C සහ D ය

**2014 A/L**

**04. වෙළෙඳපොළ ආර්ථිකයක මිලෙහි කාර්යයන් වන්නේ,**

(1) සලාක කිරීම සහ වට්ටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම ය.

(2) සංඥා සැපයීම, සානුබල සැපයීම සහ විනිමයේ මිනුමක් ලෙස ක්‍රියා කිරීම ය.

(3) සංඥා සැපයීම, සානුබල සැපයීම සහ වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම ය.

(4) සානුබල සැපයීම සහ වටිනාකමේ මිනුමක් ලෙස ක්‍රියා කිරීම ය.

(5) සංඥා සැපයීම, සානුබල සැපයීම සහ සලාක කිරීම ය.

## 2014 A/L

**05. වෙළෙඳපොළ ආර්ථිකයක පුද්ගල ආදායම තීරණය වනුයේ,**

(1) රජයේ සාධක මිල ප්‍රතිපත්තිය සහ පිහිටාධාර මත ය.

(2) සාධක වෙළෙඳපොළේ සාධක මිල සහ පෞද්ගලික ආදායම් බදු මත ය.

(3) සාධක වෙළෙඳපොළේ සාධක මිල සහ රජයේ වැටුප් ප්‍රතිපත්තිය මත ය.

(4) සාධක වෙළෙඳපොළේ සාධක සඳහා පැවති මිල සහ එම මිලට හුවමාරු වන ප්‍රමාණය මත ය.

(5) දේපළ හිමිකම සහ සාධක වෙළෙඳපොළේ සාධක මිල මත ය.

**2014 A/L**

06. නිෂ්පාදන හැකියා මායිමෙන් ඇතුළත ලක්ෂ්‍යයකින් පෙන්වන්නේ,

(1) සේවා වියුක්තියයි
(2) සම්පත් හිඟකමයි.
(3) යල්පැන ගිය තාක්ෂණයයි
(4) සම්පත් අධි භාවිතයයි
(5) නුපුහුණු ශ්‍රමය පැවතීමයි

## 2015 A/L

**01. පහත සඳහන් ප්‍රකාශන අතුරෙන් සූක්ෂම ආර්ථික විද්‍යාත්මක ප්‍රකාශනයක් වනුයේ කවරක් ද?**

(1) පසුගිය වසරේ දී රබර් මිල 10% කින් පහළ වැටුණි.

(2) පසුගිය වසරේ දී විරැකියාව ශ්‍රම හමුදාවෙන් 5.8% ක් වූයේ ය.

(3) පසුගිය වසරේ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 7% කින් ඉහළ ගියේ ය.

(4) පසුගිය වසරේ දී පොදු මිල මට්ටම් 4% කින් වැඩි විය.

(5) පසුගිය වසරේ දී රජයේ බදු අයබාරය 8% කින් අඩු විය.

## 2015 A/L

**02. ආර්ථික පද්ධතියක් තුළ තීරණ ගනු ලබන ප්‍රධාන කණ්ඩායම් තුන වනුයේ,**

(1) කුටුම්බ, ව්‍යාපාරික ආයතන සහ බැංකු වේ.

(2) කුටුම්බ, ව්‍යාපාරික ආයතන සහ රජය වේ.

(3) ව්‍යාපාරික ආයතන, රජය සහ රාජ්‍ය නොවන සංවිධාන වේ.

(4) ව්‍යාපාරික ආයතන, බැංකු සහ විදේශ වෙළඳාමේ නිරත වූවන් වේ.

(5) කුටුම්බ, රජය සහ බැංකු වේ.

## 2015 A/L

**03. කිසියම් කටයුත්තක ආවස්ථික පිරිවැය**

(1) එබඳු කටයුතු කරන සියල්ලන්ට ම එක සමාන වේ.

(2) ගණනය කිරීමේ දී මූල්‍ය පිරිවැය සහ කැප කරන ලද ආදායම් යන දෙකොටස ම ඇතුළත් කරගනී.

(3) එම කටයුත්තෙහි මූල්‍ය පිරිවැය පමණක් ඇතුළත් කර ගනී.

(4) එම කටයුත්ත නිසා කැප කරන්නට සිදු වූ ආදායම් පමණක් ඇතුළත් කර ගනී.

(5) එම කටයුත්ත නිසා හටගන්නා සෘජු ප්‍රතිලාභ පමණක් මිනුම් කරයි.

2015 A/L

04. කිසියම් රටක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රම මත

(1) තාක්ෂණය වෙනස් වෙමින් පවතී.

(2) අනික් භාණ්ඩයේ නිෂ්පාදනය අඩු නොකොට, කිසියම් භාණ්ඩයක් නිපදවිය හැකිය.

(3) නිෂ්පාදන සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය නොවේ.

(4) පවත්නා සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය වේ.

(5) ආර්ථිකයේ නිෂ්පාදන අකාර්යක්ෂමතාවයක් පවතී.

## 2015 A/L

**05. සෑම ආර්ථික කටයුත්තක දී ම නිෂ්පාදන සම්පත් එකිනෙකට පූර්ණ ආදේශක වේ නම්, පහත සඳහන් දෑ අතුරෙන් කවරක් නිවැරදි වේ ද?**

(1) සියලුම භාණ්ඩවල නිමැවුම් වැඩි කළ හැකි ය.

(2) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය සරල රේඛාවක් වනු ඇත.

(3) විශේෂ ප්‍රාගුණ්‍යනය සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළඳාමක් හට ගැනීමයට ඉඩක් නොපවතී.

(4) කිසිදු රටක් හෝ පුද්ගලයෙක් හෝ කිසිදු කටයුත්තක් සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි අත්කර ගැනීමට අසමත් වේ.

(5) නිෂ්පාදන සම්පත් හිඟය අහෝසි වී යනු ඇත.

## 2015 A/L

06. ධනවාදය පදනම් කරගත් ආර්ථිකයක පහත දැක්වෙන එක් කරුණක් හැර අන් සියල්ල දක්නට ලැබේ. එලෙස දක්නට නොලැබෙන කරුණ වනුයේ,

(1) ඉල්ලුම් හා සැපයුම මත පදනම් වූ මිල ක්‍රමයයි.

(2) පෞද්ගලික දේපළ ක්‍රමයයි.

(3) ස්වාර්ථය මත කටයුතු කරන කුටුම්බ සහ ව්‍යවසායකයන් ය.

(4) ව්‍යවසායක නිදහසයි.

(5) මධ්‍යගත සැලසුම්කරණයයි.

## 2015 A/L

**07. ආර්ථිකය තුළ ආණ්ඩුවේ සහභාගීත්වය වඩාත් ප්‍රබල ලෙස දක්නට ලැබෙන්නේ,**

(1) වෙළඳපොළ ආර්ථිකයක ය.

(2) විධානගත ආර්ථිකයක ය.

(3) මිශ්‍ර ආර්ථිකයක ය.

(4) සමාජ වෙළඳපොළ ආර්ථිකයක (social market economy) ය.

(5) සාම්ප්‍රදායික ආර්ථිකයක ය.

## 2016 A/L

**01. ආර්ථික විද්‍යාවේ 'හිඟකම' සංකල්පයෙන් අදහස් කරනුයේ,**

(1) සමාජය තමන් සතු සියලු සම්පත් කාර්යක්ෂමව උපයෝජනය නොකරන තත්ත්වයකි.

(2) පවත්නා සම්පත්වලින් මිනිසුන්ගේ වුවමනා කිසිසේත් සපුරාගත නොහැකි තත්ත්වයකි.

(3) සෑම සමාජයකම කිසියම් සාමාජික පිරිසක් දිළින්දන් ලෙස ජීවත්වන තත්ත්වයකි.

(4) සමාජයීය වශයෙන් හිතකර භාණ්ඩ හා සේවා නිපදවනවා වෙනුවට, නොවැදගත් භාණ්ඩ හා සේවා වුවමනාවටත් වඩා නිපදවන තත්ත්වයකි.

(5) නිෂ්පාදන කාර්යක්ෂම වුවත් බෙදාහැරීම අකාර්යක්ෂමව පවතින තත්ත්වයකි.

## 2016 A/L

**02. නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර, මූලයට අවතල හැඩයකින් යුතුව ඇඳිනු ලබන්නේ,**

(1) කවර හෝ භාණ්ඩයක් වැඩිපුර නිපදවන විට, එහි ආවස්ථික පිරිවැය පහළ බසින බව පිළිබිඹු කිරීමටය.

(2) ආර්ථිකය සතු සම්පත්වල හිඟකම පිළිබිඹු කිරීමටය.

(3) කවර හෝ භාණ්ඩයක් වැඩිපුර නිපදවන විට, එහි ආවස්ථික පිරිවැය ස්ථාවරව පවතින බව පිළිබිඹු කිරීමටය.

(4) ආර්ථිකයක සම්පත් බෙදීයාමේ අසාධාරණත්වය පිළිබිඹු කිරීමටය.

(5) කවර හෝ භාණ්ඩයක් වැඩිපුර නිපදවන විට, එහි ආවස්ථික පිරිවැය ඉහළ නගින බව පිළිබිඹු කිරීමටය.

## 2016 A/L

**03. නිදහස් වෙළෙඳ පොළ ආර්ථිකයක පහත සඳහන් කවර කරුණක් සාවද්‍ය වේ ද?**

(1) මිල, ආර්ථිකයේ තරඟකාරී නිෂ්පාදන ක්ෂේත්‍ර අතර සම්පත් සමසේ බෙදා වෙන් කරයි.

(2) මිල, භාණ්ඩ හා සේවාවන්හි සාපේක්ෂ හිඟකම් සහ ඒවායේ නිෂ්පාදන පිරිවැය පෙන්නුම් කරයි.

(3) සාපේක්ෂ මිල වෙනස්කම්, නිෂ්පාදන ආයතනවල ලාභ නිර්ණය කරන සාධකයක් වන අතර, එබැවින් එය නිෂ්පාදනය ධෛර්යමත් කිරීමට හෝ අධෛර්යමත් කිරීමට හෝ බලපායි.

(4) මිල, භාණ්ඩ හා සේවා සඳහා පාරිභෝගිකයින්ගේ ගෙවීමට ඇති කැමැත්ත පිළිබඳ මිනුමක් වේ.

(5) මිල, භාණ්ඩයක් ලබාගැනීම සඳහා කොපමණ කැප කළ යුතුද යන්න පිළිබඳ සංඥාවක් පාරිභෝගිකයන්ට ලබා දෙයි.

## 2016 A/L

**04. බාහිරතා නොමැති තරඟකාරී වෙළෙඳ පොළක සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව හටගනු ඇත්තේ සියලු වෙළෙඳ පොළවල මිල,**

(1) මුළු පිරිවැයට සමාන වන විට දී ය.

(2) ආන්තික අයභාරයට සමාන වන විට දී ය.

(3) ආන්තික පිරිවැයට සමාන වන විට දී ය.

(4) සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වන විට දී ය.

(5) ආන්තික නිෂ්පාදිතයේ වටිනාකමට සමාන වන විට දී ය.

## 2016 A/L

**05. ‘මානව ප්‍රාග්ධනය’ යන්නෙන් අදහස් කරනුයේ,**

(1) ප්‍රාග්ධන උපකරණ නිපදවීමට යොදා ගැනෙන ශ්‍රම සම්පතයි.

(2) ගොඩනැගිලි සහ යන්ත්‍ර සූත්‍රයි.

(3) ශ්‍රම හමුදාව සතු කුසලතා සහ දැනුම් සම්භාරයයි.

(4) ව්‍යවසායකත්වය සහ අවදානම් දැරීමේ හැකියාවයි.

(5) සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි සේවා නියුක්ත ශ්‍රම හමුදාවයි.

## 2016 A/L

**05. විභව නිමැවුම යනු,**

(1) පසුගිය දසවසර තුළ ආර්ථිකයක් සැබැවින්ම අත්කර ගත් උපරිම දළ දේශීය නිෂ්පාදිතය වේ.

(2) සමස්ත ශ්‍රම හමුදාවම වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදන අංශයේ සේවා නියුක්ත වූ කාල පරිච්ඡේදවල දී අත්කර ගත් නිමැවුම වේ.

(3) සියලු සම්පත් වඩා කාර්යක්ෂමව යොදා ගැනීමෙන් ආර්ථිකයට කිසිවිටක අත්කර ගත නොහැකි අරමුණකි.

(4) ආර්ථිකයේ සම්පත් පූර්ණ සේවා නියුක්තව, ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කරන විට නිපදවිය හැකි දළ දේශීය නිෂ්පාදිතය වේ.

(5) ආර්ථිකයේ සම්පත් පූර්ණ සේවා නියුක්තව, උපරිම මට්ටමින් උපයෝජනය කරන විට නිපදවිය හැකි දළ දේශීය නිෂ්පාදිතය වේ.

## 2017 A/L

**01. පහත සඳහන් දෑ අතුරෙන් නිෂ්පාදන සාධකයක් නොවන්නේ කවරක් ද ?**

(1) ස්වභාවික සම්පත්

(2) මානව සම්පත

(3) ප්‍රාග්ධනය

(4) මුදල්

(5) ව්‍යවසායකත්වය

## 2017 A/L

**02. හිඟකම පිළිබඳ ප්‍රශ්නය**

(1) පවතිනුයේ සංවර්ධනය වෙමින් පවත්නා ආර්ථිකයන්හි පමණි.

(2) පවතිනුයේ වෙළඳපොළ ආර්ථිකයන්හි පමණි.

(3) පවතිනුයේ භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් ඉතා අධික බැවිනි.

(4) දැනට පැවතිය හැකි වුව ද ආර්ථික වෘද්ධියත් සමඟ එය බැහැර වී යනු ඇත.

(5) පවතිනුයේ සම්පත් සීමාසහිත බැවිනි.

## 2017 A/L

**03. නිෂ්පාදන හැකියා වක්‍රයක් නිර්මාණය කිරීමේ දී පහත සඳහන් දෑ අතුරෙන් කවරක් උපකල්පනය කරනු ලැබේ ද ?**

(1) ආර්ථිකය තම සම්පත් අකාර්යක්ෂම ලෙස උපයෝජනය කරයි.

(2) සම්පත් උපයෝජනය කරනුයේ පෞද්ගලික භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා පමණි.

(3) පූර්ණ නිෂ්පාදනය නොව පූර්ණ සේවා නියුක්තිය සාක්ෂාත් කර ගනී.

(4) නිෂ්පාදන තාක්ෂණය නොවෙනස්ව පවතී.

(5) ආර්ථිකයේ උද්ධමනයක් නොපවතී.

## 2017 A/L

**04. කිසියම් ආර්ථිකයක් නිෂ්පාදන කාර්යක්ෂමතාව අත් කර ගත් විට,**

(1) වෙනත් භාණ්ඩයක නිෂ්පාදනය අඩු නොකොට තවත් භාණ්ඩයක් වැඩිපුර නිෂ්පාදනය කළ නොහැකි වේ.

(2) එක් එක් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ආන්තික පිරිවැය එම භාණ්ඩයේ මිලට සමාන වේ.

(3) සියලු ම සෘණ බාහිරතා බැහැරව ගොස් ඇත.

(4) සමාජයට වඩාත් වුවමනා කරන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා සම්පත් බෙදා වෙන් කෙරේ.

(5) සියලු ම භාණ්ඩ සම්බන්ධයෙන් ස්වයංපෝෂිත තත්ත්වයකට පත් වේ.

## 2017 A/L

**05. කුමක් නිෂ්පාදනය කරන්නේ ද? සහ කා සඳහා නිෂ්පාදනය කරන්නේ ද? යන මූලික ආර්ථික ප්‍රශ්න අවශ්‍යයෙන්ම අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙක බැඳී පවතී. මක් නිසාද යත්,**

(1) වෙනස් වෙනස් ආදායම් ව්‍යාප්ති රටා වෙනස් වෙනස් ඉල්ලුම් රටාවන් ජනනය කෙරෙන බැවින් ඒවාට අනුරූප වන ලෙස සම්පත් බෙදා වෙන් කිරීමේ රටාවන් ද වෙනනස් වන බැවිනි.

(2) වෙනස් වෙනස් නිෂ්පාදන ක්‍රම ශිල්ප වෙනස් වෙනස් ආදායම් ව්‍යාප්ති රටා ජනනය කරන බැවිනි.

(3) සමාජයේ ආර්ථික වශයෙන් ප්‍රබල කණ්ඩායම වෙත ආදායම් හා ධනය සංකේන්ද්‍රණය වී ඇති බැවිනි.

(4) සම්පත් කාර්යක්ෂම ලෙස බෙදා වෙන්කිරීමෙහිලා වෙළඳපොළ මත විශ්වාසය තැබිය නොහැකි බැවිනි.

(5) කිසියම් නිශ්චිත නිමැවුම් මට්ටමක් යෙදවුම්වල විවිධ සංයෝජන ඔස්සේ නිෂ්පාදනය කළ හැකි බැවිනි.

**2017 A/L**

**06.** වෙළඳපොළ ආර්ථිකයක මිලෙහි ප්‍රධාන කාර්යය වනුයේ

(1) ව්‍යවසායකයන් උදෙසා වඩ වඩා ලාභ ජනනය කර දීමයි.

(2) ආයෝජන ඉඩ ප්‍රස්තා තෝරා ගැනීම සඳහා කුටුම්බවලට මගපෙන්වීමය.

(3) ඉල්ලුම් වක්‍රවල නම්‍යතාව නිර්ණය කිරීම ය.

(4) ආදායම් ව්‍යාප්තිය උසස් කරලීම ය.

(5) හිඟ සම්පත් විකල්ප භාවිත අතර බෙදා වෙන්කරලීම ය.

## 2018 A/L

**01. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් අභිමතානුරූපී ප්‍රකාශයක් වනුයේ කුමක් ද?**

(1) ඉන්ධන මිල ඉහළ යාම විදුලි මෝටර් රථ සඳහා ඉල්ලුම ධෛර්යමත් කරන්නේ ය.

(2) ආදායම වැඩි වන්නේ නම් සුඛෝපභෝගී භාණ්ඩ අලෙවිය පහළ වැටෙන්නේ ය.

(3) ලැප්ටොප් මිල පහළ වැටෙන විට මිනිසස්සු ඒවා වැඩියෙන් මිල දී ගනිති.

(4) නිවාස හිමියන් අය කරන ගෙවල් කුලී රජය විසින් පාලනය කළ යුතුය.

(5) භාණ්ඩයක ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය, එහි මිල වෙනස් වීම සමග ප්‍රතිවිරුද්ධ ලෙස සම්බන්ධව පවතී.

**2018 A/L**

**02. නිෂ්පාදන සාධකයක් ලෙස භූමියට උදාහරණයක් වශයෙන් පහත සඳහන් කවරක් දැක්විය හැකි ද?**

(1) මාගම්පුර වරාය

(2) දක්ෂිණ අධිවේගී මාර්ගය

(3) වික්ටෝරියා වේල්ල

(4) අඹේවෙල කිරි ගොවිපළ

(5) පාසිකුඩා වෙරළ තීරය

## 2018 A/L

**03. නිෂ්පාදන හැකියා වක්‍රය මත කටයුතු කරන ආර්ථිකයක් සම්බන්ධයෙන් පහත සඳහන් කවරක් සැමවිටම නිවැරදි වන්නේ ද?**

(1) එය නිදහස් වෙළඳපොල ආර්ථිකයක් විය යුතුය.

(2) එය විධාන ආර්ථිකයක් විය යුතුය

(3) එහි සම්පත් පූර්ණ සේවා නියුක්තියෙහි පවතී.

(4) එය නිෂ්පාදන කාර්යක්ෂමතාව අත්කරගෙන ඇති නමුදු සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව එයට කිසිසේත් අත්කර ගත නොහැක.

(5) එයට රේඛීය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් තිබිය යුතුය.

## 2018 A/L

**04.** නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පෙන්නුම් කෙරෙන රූපසටහනක, ආවස්ථික පිරිවැය නිරූපණය කෙරෙනුයේ,

(1) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ බෑවුමෙනි

(2) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ඇතුළත ලක්ෂ්‍යයකිනි.

(3) මූලය හරහා අදිනු ලබන සරල රේඛාවකිනි.

(4) සිරස් අක්ෂය මත ලක්ෂ්‍යයෙනි.

(5) තිරස් අක්ෂය මත ලක්ෂ්‍යයෙනි.

**2018 A/L**

**05.** පහත සඳහන් දෑ අතුරෙන් මනාව ක්‍රියාත්මක වන ධනේෂ්වර ආර්ථිකයන් සඳහා අවශ්‍ය වන්නාවූත්, විධාන ආර්ථිකයන් සඳහා අවශ්‍ය නොවන්නාවූත් කරුණ කවරක් ද?

(1) මධ්‍යගත තීරණ ගැනීම

(2) සම්පත් හිගකම

(3) ඒකාධිකාරී ආයතන

(4) දේපළ හිමිකම් සුරැකීම

(5) ධන බාහිරතා

**2018 A/L**

06. කිසියම් ආයතනයක් සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව සහිත නිමැවුම් මට්ටමෙහි සිටින විට,

(1) මුළු අයභාරය මුළු පිරිවැයට සමාන වේ.

(2) ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වේ.

(3) ආන්තික අයභාරය ආන්තික පිරිවැය ඉක්මවා යයි.

(4) මිල සාමාන්‍ය මුළු පිරිවැයට සමාන වේ.

(5) මිල ආන්තික පිරිවැයට සමාන වේ.

## 2019 A/L

01. එක් එක් කුටුම්බයන්හි සහ ආයතනයන් හි තීරණ පිළිබඳ අධ්‍යනය කෙරෙන ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය වනුයේ.

(1) සාර්ව ආර්ථික විද්‍යාව ය.

(2) සුක්ෂ්ම ආර්ථික විද්‍යාව ය.

(3) යථානුරූපි ආර්ථික විද්‍යාව ය.

(4) අභිමතානුරූපි ආර්ථික විද්‍යාව ය.

(5) ශුභසාධන ආර්ථික විද්‍යාව ය.

**2019 A/L**

**02. භූමිය ශ්‍රමය ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්ව යන සම්පත්වල හිමිකරුවන් වෙත කෙරෙන ආදායම් ගෙවීම පිළිවෙළින්,**

(1) පොළිය, වැටුප්, බදු කුලිය සහ ලාභ වේ.

(2) බදු කුලිය, වැටුප් ලාභාංශ සහ පොලිය වේ.

(3) බදු කුලිය, ලාභ,වැටුප් සහ පොලිය වේ.

(4) බදු කුලිය, වැටුප්, පොලීය සහ ලාභ වේ.

(5) පොලිය, වැටුප් ලාභාංශ සහ බදු කුලිය වේ.

## 2019 A/L

**03. පහත සදහන් දෑ අතුරින් විධාන ආර්ථික පද්ධතියක කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ කවරක්ද ?**

(1) ප්‍රාග්ධනය පිළිබඳ පෞද්ගලික හිමිකම

(2) වෙළෙඳපොළ මත දැඩිව රැඳා පැවතීම


(3) මධ්‍යගත සැලසුම්කරණය

(4) වෙළෙඳපොල බලය සංකේන්ද්‍රණය වීම

(5) ස්වාර්ථය පදනම් කොට තීරණ ගැනීම

## 2019 A/L

**04.** A ලක්ෂ්‍යයේ නිෂ්පාදනයෙහි නිරතව සිටින ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පහත රූපසටහන පෙන්නුම් කෙරේ.




Y භාණ්ඩයෙන් නිෂ්පාදනය කරනු ලබන නිමැවුම් ප්‍රමාණය වෙනුවෙන් X භාණ්ඩයෙන් කැප කරන ලද නිමැවුම් ප්‍රමාණය කොපමණද ?

(1) 100 (2) 200 (3) 300 (4) 400 (5) 500

**2020 A/L**

**01. නොමිල භාණ්ඩයක (free good) දක්නට ලැබෙන්නේ පහත කවර ලක්ෂණය ද?**

(1) එම භාණ්ඩයට ඇති ඉල්ලුමට සාපේක්ෂව කිසියම් හිඟමනක් දක්නට ලැබේ.

(2) එම භාණ්ඩයෙ සැපයීමේ ආවස්ථික පිරිවැයක් නොමැත.

(3) එම භාණ්ඩයේ පරිභෝජනය හෝ නිෂ්පාදනය හෝ කිසිදු බාහිරතාවක් ජනනය නොකරයි.

(4) එම භාණ්ඩය රජය විසින් ගාස්තුවක් අයකිරීමකින් තොරව සපයනු ලැබේ.

(5) එම භාණ්ඩයේ පරිභෝජනය සමාජයීය වශයෙන් හිතකර බැවින් එය රජය විසින් ම සපයනු ලැබේ.

## 2020 A/L

**02. ආර්ථික විද්‍යාඥයින් 'ප්‍රාග්ධනය' පදයෙන් සුවිශේෂ වශයෙන් අදහස් කරනුයේ,**

(1) වෙනත් භාණ්ඩ සහ සේවාවන් නිෂ්පාදනය කිරීම උදෙසා මිනිසා විසින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩයන් ය.

(2) ව්‍යාපාර වස්තු (stocks) සහ පිළිනපත් ස්වරූපයෙන් ප්‍රාග්ධනය මිලයට ගැනීමට යොදා ගනු ලැබූ මුදල් ය.

(3) ප්‍රාග්ධනය මිළයට ගැනීමේ අරමුණින් කුටුම්බ විසින් සමුච්චනය කරගනු ලැබූ ඉතුරුම් ය.

(4) ප්‍රාග්ධනය මිළයට ගැනීම සඳහා ව්‍යවසායකයෙක් විසින් භාවිත කරන ලද මුදල් ය.

(5) මූර්ත දේපල, වනාන්තර, ලෝහ සහ ඛනිජ සම්පත් ය.

**2020 A/L**

**03. 'සෑම ආර්ථික පද්ධතියක්ම හිඟකම පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දේ' යන ප්‍රකාශයෙන් කවරක් අදහස් වේ ද?**

(1) සමාජයේ දක්නට ඇති ඇතැම් සම්පත්වල ප්‍රමාණයන් ඒවාට ඇති ඉල්ලුමද ඉක්මවා යන බව ය.

(2) රටක ඛනිජ නිධි දක්නට ලැබෙනුයේ ඉතා නිශ්චිත ප්‍රමාණයකින් පමණක් බව ය.

(3) සම්පත් හිඟකම නිසා පූර්ණ සේවා නියුක්තිය අත්කර ගැනීමට රටවල් අසමත් වී සිටින බව ය.

(4) සමාජයේ සියලු වුවමනා සපුරාලීමට තරම් ඵලදායි සම්පත් ප්‍රමාණවත් නොවන බව ය.

(5) ආර්ථික පද්ධති වරින් වර චක්‍රීය ප්‍රසාරණ අවධිවලට මුහුණ දෙන අතර එවැනි අවස්ථාවල දී සම්පත් හිඟකම හටගන්නා බව ය.

## 2020 A/L

**04. නිෂ්පාදන හැකියා වක්‍රයක් මත සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතා ලක්ෂ්‍යය අත්කරගත හැකි වනුයේ,**

(1) අවම යෙදවුම් ප්‍රමාණයක් භාවිත කරමින් එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කරන විටදී ය.

(2) ආන්තික ප්‍රතිලාභ ආන්තික පිරිවැයට සමාන වන මට්ටමට එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කරන විටදී ය.

(3) පාරිභෝගික භාණ්ඩවලට සාපේක්ෂව ප්‍රාග්ධන භාණ්ඩ විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන විටදී ය.

(4) ප්‍රාග්ධන භාණ්ඩවලට සාපේක්ෂව පාරිභෝගික භාණ්ඩ විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන විටදී ය.

(5) භාණ්ඩයේ මිල ආන්තික ප්‍රතිලාභ ඉක්මවා යන මට්ටමේදී එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කරන විටදී ය.

**2021 A/L**

01. ආර්ථික විද්‍යාව පිළිබඳ වඩාත් සම්පූර්ණ කෙටි නිර්වචනයක් වනුයේ ආර්ථික විද්‍යාව යනු,

(1) සෑම පුරවැසියන්ට වඩාත් යහපත් තත්ත්වයක් ඇති කිරීම සඳහා සමාජයේ රැකියා අවස්ථා නිර්මාණය කළ හැක්කේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම ය

(2) රටවල් ගෝලීය වෙළෙඳපොළක භාණ්ඩ හා සේවා වෙළෙඳාම් කරනුයේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම ය

(3) පරිසරයට හානියක් නොවන පරිදි භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරනු ලබන්නේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම ය

(4) සීමිත වුවමනා අතර අසීමිත සම්පත් බෙදා වෙන්කරනු ලබන්නේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම ය

(5) අසීමිත වුවමනා සපුරාලීම සඳහා හිඟ සම්පත් බෙදා වෙන්කරනු ලබන්නේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම ය

**2021 A/L**

02. නිෂ්පාදන හැකියා පර්යන්තයන් සරල රේඛීය වනුයේ,

(1) සම්පත් පූර්ණ වශයෙන් සහ කාර්යක්‍ෂමව උපයෝජනය කරමින් පවත්නා නිසා ය

(2) වැඩෙන ආවස්ථික පිරිවැය නීතිය නිසා යි

(3) ආර්ථිකයේ පවත්නා අකාර්යක්ෂමතා නිසා ය

(4) ආවස්ථික පිරිවැය ස්ථාවර වීම නිසා ය

(5) සම්පත් සමජාතීය නොවීම නිසා ය

**2021 A/L**

**03. පහත සඳහන් කවරක් නිදහස් වෙළඳපොළ ආර්ථිකයෙහි මූලික ලක්ෂණයක් වේද?**

(1) නිෂ්පාදනය පිළිබඳ රජයේ දැඩි පාලනය

(2) අපනයනවලට වඩා වැඩි ආනයන

(3) සම්පත් පිළිබඳ පොදු අයිතිය

(4) පෞද්ගලික දේපල

(5) රජය විසින් නියම කළ මිල සහ වැටුප්

**2021 A/L**

**04. ශ්‍රමික විභාජනයෙන් අත්වන ප්‍රතිලාභයක් නොවන්නේ කුමක්ද?**

(1) ශ්‍රම බලකායේ නම්‍යශීලිත්වය ඉහළ යාම

(2) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ මුළු පිරිවැය පහළ යාම

(3) ඵලදායිතාව ඉහළ යාම

(4) නවෝත්පාදන හඳුන්වාදීමේ හැකියාව ඉහළ යාම

(5) ආදායම් සමතාව ඉහළ යාම

**2022 A/L**

**01. ආර්ථික විද්‍යාවේ කේන්ද්‍රීය ප්‍රශ්නය වනුයේ**

(1) සාධාරණ බදු ක්‍රමයක් ස්ථාපිත කරගැනීම ය

(2) සෑම පුරවැසියෙක් සඳහාම අවම ආදායමක් සහතික කිරීම ය

(3) වුවමනා තෘප්තිමත් කරලීම සඳහා හිඟ නිෂ්පාදන සම්පත් බෙදා වෙන්කර දීම ය

(4) සම්පත් අධි උපයෝජනය වීම වළක්වාගනු පිණිස නීති පද්ධතියක් පනවා ගැනීම ය

(5) සම්පත් නාස්ති නොකරමින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම ය

## 2022 A/L

**02. නිෂ්පාදන හැකියා වක්‍රය පිටතට හෝ දකුණු පසට හෝ විතැන්වීමට හේතු වනුයේ පහත සඳහන් කවරක්ද?**

(1) විරැකියාව ඉහළ යාමක්

(2) ස්වාභාවික සම්පත්වල අඩුවීමක්

(3) උද්ධමනය ඉහළ යාමක්

(4) සේවක සංඛ්‍යාවේ අඩුවීමක්

(5) ප්‍රාග්ධන තොගයේ ඉහළ යාමක්

## 2022 A/L

**03.** පහත සඳහන් දෑ අතුරින් නිෂ්පාදන හැකියා වක්‍ර යොදා ගනිමින් පෙන්නුම් කළ නොහැකි වනුයේ,

(1) පාරිභෝගික ඉල්ලුම ය

(2) විභව නිමැවුම ය

(3) ආර්ථික වෘද්ධි ය

(4) ආවස්ථික පිරිවැය ය

(5) විරැකියාව ය

**2022 A/L**

**04. සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක ලක්ෂණයක් වන්නේ පහත සඳහන් කවරක්ද?**

(1) සියලු සම්පත්වල පෞද්ගලික හිමිකාරිත්වය.

(2) සියලු සම්පත්වල පොදු හිමිකාරිත්වය.

(3) මිල ක්‍රමයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ නියාමන රාමුවක් නොතිබීම.

(4) සුබසාධන සේවා සැපයීමේ දී රජයේ කාර්යභාරය ප්‍රබල වීම.

(5) මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමට මධ්‍යගත සැලසුම්කරණය භාවිතා කිරීම

## 2023 A/L

**01. ආර්ථික සම්පත් ප්‍රධාන කොටස් දෙකකට පහසුවෙන් ම වර්ගීකරණය කළ හැකි වනුයේ,**

(1) ප්‍රාග්ධන සම්පත් සහ ස්වාභාවික සම්පත් වශයෙනි.

(2) භූමිය සහ ප්‍රාග්ධනය වශයෙනි.

(3) ස්වාභාවික සම්පත් සහ මානව සම්පත් වශයෙනි.

(4) දේපළ සම්පත් සහ මානව සම්පත් වශයෙනි.

(5) ශ්‍රමය සහ ව්‍යවසායකත්වය වශයෙනි.

## 2023 A/L

**02. ආර්ථික විද්‍යාවේ විග්‍රහ කරන ආකාරයට අවශ්‍යතා සහ වුවමනා අතර මූලික වෙනස කවරක් ද?**

(1) අවශ්‍යතා දිවි රැක ගැනීමට අත්‍යවශ්‍ය වන අතර වුවමනා වූ කලි හුදු කැමති දේවල් පමණි.

(2) වුවමනා දිවි රැක ගැනීමට අත්‍යවශ්‍ය වන අතර අවශ්‍යතා වූ කලි හුදු කැමති දේවල් පමණි.

(3) ආර්ථික විද්‍යාව තුළ අවශ්‍යතා සහ වුවමනා සමානාර්ථයෙන් සැලකේ.

(4) වුවමනා සීමිත සම්පත් වලින් තෘප්තිමත් කරගත හැකි අතර අවශ්‍යතා සීමිත සම්පත්වලින් තෘප්තිමත් කරගත හැකි නොවේ.

(5) අවශ්‍යතා කාලයත් සමඟ වෙනස් වන අතර වුවමනා කාලයත් සමඟ වෙනස් නොවේ.

**2023 A/L**

**03.** X සහ Y භාණ්ඩ දෙක පමණක් නිෂ්පාදනය කරන එක්තරා රටක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයෙහි ලක්ෂ්‍ය තුනක් පහත දැක්වේ.

| නිෂ්පාදන හැකියාවන් | X භාණ්ඩය | Y භාණ්ඩය |
|---|---|---|
| A | 3 | 0 |
| B | 2 | 3 |
| C | 0 | 9 |

මෙම නිෂ්පාදන හැකියා දත්ත වලට අනුව නිගමනය කළ හැකි වනුයේ,

(1) මෙම රටෙහි සම්පත් සමජාතීය බවය.

(2) X භාණ්ඩයේ ඒකක 3ක් සහ Y භාණ්ඩයේ ඒකක 9ක් සහිත සංයෝජනය අත්කර ගත හැකි බවය.

(3) X භාණ්ඩයේ ඒකක 3ක් සහ Y භාණ්ඩයේ ඒකක 9ක් සහිත සංයෝජනය අත්කර ගැනීම සඳහා සියලු ම සම්පත් යොදා ගැනීම අවශ්‍ය නොවන බවය.

(4) Y භාණ්ඩයෙන් නිෂ්පාදනය කෙරෙන ඒකක ප්‍රමාණය වැඩි කරන විට X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය වැඩි වන බවය.

(5) Y භාණ්ඩයෙන් නිෂ්පාදනය කෙරෙන ඒකක ප්‍රමාණය වැඩි කරන විට X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය අඩු වන බවය.

**2023 A/L**

04. ප්‍රාග්ධනයේ රාජ්‍ය හිමිකාරීත්වය සහ සම්පත් බෙදා වෙන් කිරීම සඳහා වෙළෙඳපොළ මත රැඳා පැවැත්ම යන ලක්ෂණ සහිත ආර්ථික පද්ධතිය කවරක් වේද?

(1) ධනේශ්වර ක්‍රමය

(2) සමාජවාදය

(3) සමාජ වෙළෙඳපොළ ආර්ථිකය

(4) සමාජවාදී වෙළෙඳ පොළ ආර්ථිකය

(5) විධාන ආර්ථිකය

## 2024 A/L

**01. අභිමතානුරූපී ආර්ථික විද්‍යාව සහ යථානුරූපී ආර්ථික විද්‍යාව අතර පවත්නා මූලික වෙනස වනුයේ,**

(1) අභිමතානුරූපී ආර්ථික විද්‍යාව විස්තරාත්මක විශ්ලේෂණයක් ලබා දීමත් යථානුරූපී ආර්ථික විද්‍යාව ප්‍රතිපත්තිමය නිර්දේශ ලබා දීමත් ය.

(2) යථානුරූපී ආර්ථික විද්‍යාව කරුණු මත පදනම් වීමත් අභිමතානුරූපී ආර්ථික විද්‍යාව සාරධර්ම මත පදනම් වීමත් ය.

(3) අභිමතානුරූපී ආර්ථික විද්‍යාව ප්‍රත්‍යක්ෂමූල සාක්ෂි මත පදනම් වීමත් යථානුරූපී ආර්ථික විද්‍යාව ආත්මීය අදහස් මත පදනම් වීමත් ය.

(4) යථානුරූපී ආර්ථික විද්‍යාව අගය විනිශ්චය මත විශ්වාසය තැබීමත් අභිමතානුරූපී ආර්ථික විද්‍යාව විෂය මූල වීමත් ය.

(5) යථානුරූපී ආර්ථික විද්‍යාව ආචාර ධර්ම කෙරෙහි අවධානය යොමු කිරීමත් අභිමතානුරූපී ආර්ථික විද්‍යාව පරීක්ෂාවට ලක් කළ හැකි කල්පිත කෙරෙහි අවධානය යොමු කිරීමත් ය.

## 2024 A/L

**02. ආර්ථික විද්‍යාවේ 'ප්‍රාග්ධනය' සංකල්පය වඩාත් මැනවින් පැහැදිලි කරනුයේ පහත සඳහන් කවර ප්‍රකාශයද?**

(1) ප්‍රාග්ධනය නිෂ්පාදන ක්‍රියාවලිය තුළ යොදා ගැනෙන මානව ශ්‍රමය සහ නව්‍යතා නියෝජනය කරයි.

(2) පුද්ගලයන් විසින් කරනු ලබන ඕනෑම මූල්‍ය ආයෝජනයක් ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ.

(3) ප්‍රාග්ධනයට ඇතුළත් වනුයේ නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන යන්ත්‍ර සූත්‍ර සහ ගොඩනැගිලි වැනි ස්පෘෂ්‍ය වත්කම් පමණක් ය.

(4) ප්‍රාග්ධනය යනු නිෂ්පාදනයට අරමුදල් සපයා ගැනීම සඳහා යොදා ගැනෙන මූල්‍ය සම්පත්ය.

(5) ප්‍රාග්ධනය යනු නිෂ්පාදනය කරන ලද නිෂ්පාදන මාධ්‍යයන් ය.

**2024 A/L**

**03. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය දිගේ එක් ලක්ෂ්‍යයක සිට තවත් ලක්ෂ්‍යයකට ගමන් කිරීමේදී**

(1) ආවස්ථික පිරිවැයෙහි හෝ නිෂ්පාදන කාර්යක්ෂමතාවේ හෝ වෙනසක් සිදු නොවේ.

(2) ආවස්ථික පිරිවැයෙහි වෙනසක් සිදුවන නමුදු නිෂ්පාදන කාර්යක්ෂමතාවේ වෙනසක් සිදු නොවේ.

(3) නිෂ්පාදන කාර්යක්ෂමතාවේ වෙනසක් සිදුවන නමුදු ආවස්ථික පිරිවැයෙහි වෙනසක් සිදු නොවේ.

(4) ආවස්ථික පිරිවැයෙහි හෝ සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාවේ හෝ වෙනසක් සිදු නොවේ.

(5) නිෂ්පාදන කාර්යක්ෂමතාවේ වෙනසක් සිදුවන නමුදු සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාවේ වෙනසක් සිදු නොවේ.

**2024 A/L**

**04. සමාජවාදී ආර්ථික පද්ධතියක ප්‍රධාන ලක්ෂණය වනුයේ,**

(1) මුඛ්‍ය අරමුණ ලෙස ලාභය උපරිම කිරීමයි.

(2) සියලු නිෂ්පාදන මාධ්‍යවල පෞද්ගලික හිමිකාරිත්වයයි.

(3) ප්‍රධාන කර්මාන්ත සහ සම්පත්වල පොදු අයිතියයි.

(4) ආර්ථිකයට රජයේ මැදිහත්වීම අවම වීමයි.

(5) ආර්ථික තීරණ සම්බන්ධයෙන් රජය කිසිදු කාර්යභාරයක් ඉටු නොකිරීමයි.

2025 A/L

**01. සෑම සමාජයකම කේන්ද්‍රීය ආර්ථික ගැටලුව ලෙස හිඟකම සැලකෙනුයේ,**

(1) එය විරැකියාව හා උද්ධමනය වැඩි කිරීමට හේතු වන බැවිනි.

(2) අසීමිත මිනිස් වුවමනා සපුරාලීම සඳහා සමාජය සතු සම්පත් සීමිත බැවිනි.

(3) මෙම ගැටලුව විසඳීම සඳහා රජයේ මැදිහත්වීම අකාර්යක්ෂම බැවිනි.

(4) සමාජයේ අසීමිත මිනිස් වුවමනා සපුරාලීමට ප්‍රමාණවත් මට්ටමකට සාධක ඵලදායිතාව ඉහළ නැංවීමට තාක්ෂණයට නොහැකි බැවිනි.

(5) සියලුම සම්පත් සමජාතීය වන නිසා සමාජ අවශ්‍යතා සපුරාලීමට නොහැකි බැවිනි.

## 2025 A/L

**02. අවශ්‍යතා සහ වුවමනා අතර මූලික වෙනසවඩාත්හොඳින් පැහැදිලි කෙරෙනුයේ පහත සඳහන් කවරප්‍රකාශයෙන්ද**

(1) අවශ්‍යතා කාලයත් සමඟ වෙනස් වේ. නමුත් වුවමනා නොවෙනස්ව පවතී.

(2) අවශ්‍යතා අසීමිත ය. නමුත් වුවමනා සීමිතය.

(3) අවශ්‍යතා සංස්කෘතික බලපෑම් වෙතින් පැන නගින අතර වුවමනා ජීව විද්‍යා විද්‍යාත්මක වේ

(4) අවශ්‍යතා සෑම විටම නිෂ්පාදකයන් විසින් නිර්මාණය කරනු ලබයි. නමුත් වුවමනා පාරිභෝගිකයන් විසින් නිර්මාණය කරනු ලැබේ.

(5) අවශ්‍යතා ජීවිතයේ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය වේ. නමුත් වුවමනා ජීවිතය පවත්වා ගැනීමෙන් ඔබ්බට ඇති ආශාවන් පිළිබිඹු කරයි.

**2025 A/L**

**03.** පහත සදහන් ඒවායින් ශ්‍රම ඵලදායීතාවය තීරණය කරන සාධකයක් නොවන්නේ කුමක්ද ?

(1) අධ්‍යාපනය සහ පුහුණුව

(2) සේවකයන්ගේ අභිප්‍රේරණය

(3) සේවා නියුක්ති අනුපාතිකය ඉහළ යාම

(4) උසස් තාක්ෂණය ලබා ගැනීමේ හැකියාව

(5) වැඩ කරන වේලාවන් දීර්ඝ කිරීම

## 2025 A/L

**04.** ආර්ථිකය දිගටම එකම නිෂ්පාදන ලක්ෂ්‍යයක රැඳී සිටිමින් නිෂ්පාදනයෙහි යෙදී සිටින අතරතුර නිෂ්පාදන හැකියා වක්‍රයෙහි පිටතට විතැන්වීමක් හඟවනුයේ,

(1) සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු වී ඇති බව ය.

(2) නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩි දියුණු වී ඇති බව ය.


(3) කාර්යක්ෂමතාවයෙහි වැඩි දියුණුවීමකින් තොරව ආර්ථික වෘද්ධිය භට ගෙන ඇති බව ය.

(4) ආවස්ථික පිරිවැය අඩු වී ඇති බව ය.

(5) ආර්ථිකය එහි ධාරිතාව ඉක්මවා නිෂ්පාදනයෙහි යෙදී සිටින බව ය.

**2012 A/L**

**01.**




X නමැති භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම ඉහත රූප සටහන පෙන්නුම් කරයි එහි A ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය කරා ගමන් කිරීමට බලපෑ ප්‍රධාන සාධක වනුයේ,

(1) Y නමැති ආදේශක භාණ්ඩයෙහි මිල ඉහළ යාමය.

(2) පාරිභෝගිකයන්ගේ ආදායමෙහි ඉහළ යාමය.

(3) පාරිභෝගිකයන්ගේ ආදායමෙහි පහළ යාමය.

(4) X භාණ්ඩයෙහි නිෂ්පාදන පිරිවැය අඩු වීමය.

(5) X භාණ්ඩයෙහි සැපයුම අඩු වීමය.

## 2012 A/L

**02. කිසියම් භාණ්ඩයක සැපයුම් වක්‍රය වමට විතැන් කිරීමෙහි ලා බලපානුයේ පහත සඳහන් කවර කරුණක් ද ?**

(1) නිෂ්පාදන පිරිවැය ඉහළ යාම

(2) නිෂ්පාදන පිරිවැය පහළ යාම

(3) භාණ්ඩයෙහි මිල ඉහළ යාම

(4) භාණ්ඩයෙහි මිල ඉහළ යාම

(5) ඉල්ලුම අඩු වීම

## 2012 A/L

**03.** අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී සහල් මිල අඩු වූවිට සහල් සඳහා තමන් විසින් වැය කරනු ලැබූ මුළු වියදම නොවෙනස්ව, පැවැති බව කිසියම් පාරිභෝගිකයෙක් නිරීක්ෂණය කරයි. මෙම මිල වෙනස්වීම් සම්බන්ධයෙන් එළැඹිය හැකි නිවැරදි නිගමනය වනුයේ කවරක් ද?

(1) මෙම පාරිභෝගිකයා සහල් , බාල භාණ්ඩයක් ලෙස සලකයි.

(2) මිල වෙනස්වීමට සංවේදී ව සහල් සඳහා පාරිභෝගිකයාගේ ඉල්ලුම වැඩි වූයේය.

(3) සහල් සඳහා පාරිභෝගිකයාගේ ඉල්ලුම පූර්ණ මිල නම්‍යතාවයක් පෙන්නුම් කරයි.

(4) සහල් සඳහා පාරිභෝගිකයාගේ ඉල්ලුම පූර්ණ මිල අනම්‍යතාවයක් පෙන්නුම් කරයි.

(5) සහල් සඳහා පාරිභෝගිකයාගේ ඉල්ලුම ඒකීය මිල නම්‍යතාවයක් පෙන්නුම් කරයි.

## 2012 A/L

**04. සරල අවම ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීම නිසා,**

(1) පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදන අතිරික්තය ඉහළ නගී.

(2) පාරිභෝගික අතිරික්තය ඉහළ නගින අතර , නිෂ්පාදන අතිරික්තය පහළ බසී.

(3) පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදන අතිරික්තය පහළ බසී.

(4) පාරිභෝගික අතිරික්තය පහළ බසින අතර , නිෂ්පාදන අතිරික්තය ඉහළ නගී.

(5) පාරිභෝගික අතිරික්තයට හා නිෂ්පාදන අතිරික්තයට කිසිදු බලපෑමක් නොවේ.

(02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2012 A/L**

**05.** X භාණ්ඩය සඳහා ආදායම් ඉල්ලුම් නම්‍යතාව ඍණ අගයක් ද, X සහ Y යන භාණ්ඩ අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතාව ඍණ අගයක් ද වේ නම්, X භාණ්ඩය පිළිබඳ ව පහත සඳහන් කවරත් නිවැරදි වේද?

(1) X සාමාන්‍ය භාණ්ඩයක් වන අතර, එය Y භාණ්ඩය සඳහා ආදේශකයක් ද වේ.

(2) X සාමාන්‍ය භාණ්ඩයක් වන අතර, එය Y භාණ්ඩය සමඟ අනුපූරක සම්බන්ධයක් පෙනනුම් කරයි.

(3) X බාල භාණ්ඩයක් වන අතර, එය Y භාණ්ඩය සඳහා ආදේශකයක් ද වේ.

(4) X බාල භාණ්ඩයක් වන අතර, එය Y භාණ්ඩය සමඟ අනුපූරක සම්බන්ධයක් පෙනනුම් කරයි.

(5) X සාමාන්‍ය භාණ්ඩයක් වන අතර Y බාල භාණ්ඩයක් වේ.

## 2012 A/L

**06.** බෝතල් කරන ලද පානීය ජලය සඳහා ඇති ඉල්ලුම, සාපේක්ෂ වශයෙන් මිල නම්‍ය වෙතියි සලකන්න. මෙම තත්ත්වය යටතේ බෝතල් කරන ලද පානීය ජල සැපයුමෙහි වැඩි වීමක් සිදු වුවහොත් පහත සඳහන් කවර ප්‍රතිවිපාකයක් හට ගනු ලැබේ ද?

(1) මුළු අයභාරය ඉහළ නංවමින් මිළ පහළ බසී.

(2) මුළු අයභාරය පහළ හෙළමින් මිළ පහළ බසී.

(3) බෝතල් කරන ලද පානීය ජලයෙහි අධි සැපයුමක් හට ගනී.


(4) බෝතල් කරන ලද පානීය ජලය සඳහා අධි ඉල්ලුමක් හට ගනී.

(5) මිලෙහි සාපේක්ෂ වශයෙන් සුළු අඩු වීමක් හට ගන්නා නමුදු සමතුලිත ප්‍රමාණයෙහි වෙනසක් හට නොගනී.

## (02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2013 A/L**

**01.** එක්තරා භාණ්ඩයක් සඳහා අදාළ වෙළෙඳපොළ ඉල්ලුම හා සැපයුම් වක්‍ර රූප සටහනෙහි දැක්වේ.




සමතුලිත ඒකක ප්‍රමාණය මිලදී ගැනීම සඳහා පාරිභෝගිකයන් විසින් ගෙවීමට කැමති මුළු මුදල් ප්‍රමාණය රූපසටහනෙහි නිරූපණය කෙරෙන ප්‍රදේශය වන්නේ

(1) OQEP ය. (2) OTEQ ය (3) PEK ය (4) OKM ය (5) OKEQ ය

(02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

## 2013 A/L

**02.** අදාළ භාණ්ඩ සඳහා ඇති කිට්ටු ම ආදේශක භාණ්ඩවල මිල සැලකිල්ලට ගනිමින්, කිසියම් සමාගම් පහක් විසින් නිපදවනු ලබන භාණ්ඩ සඳහා ඇති ඉල්ලුමේ හරස් මිල නම්‍යතා පහත සඳහන් වගුවේ දැක්වේ.

| සමාගම | හරස් මිල ඉල්ලුම නම්‍යතාව |
|---|---|
| A සමාගම | + 3.0 |
| B සමාගම | + 2.5 |
| C සමාගම | + 1.0 |
| D සමාගම | + 0.8 |
| E සමාගම | + 0.2 |

මේ අනුව ඉහත සමාගම් අතුරෙන් වැඩි ම වෙළෙඳපොළ බලය හිමි ව ඇත්තේ කවර සමාගමකට ද?

(1) A සමාගමට ය.

(2) B සමාගමට ය.

(3) C සමාගමට ය.

(4) D සමාගමට ය.

(5) E සමාගමට ය.

**2013 A/L**

**03.** පහත දී ඇති අවස්ථා අතුරෙන් නිෂ්පාදන ආයතනයේ මුළු අයභාරය පහළ වැටෙනුයේ කවර අවස්ථාවක දී ද?

(1) සැපයුම නම්‍ය තත්ත්වයක තිබිය දී මිල ඉහළ යන විට

(2) ඉල්ලුම නම්‍ය තත්ත්වයක තිබිය දී මිල පහළ යන විට

(3) ඉල්ලුම අනම්‍ය තත්ත්වයක තිබිය දී මිල ඉහළ යන විට

(4) ඉල්ලුම නම්‍ය තත්ත්වයක තිබිය දී මිල ඉහළ යන විට

(5) ඉල්ලුම ඒකීය නම්‍ය තත්ත්වයක තිබිය දී මිල පහළ යන විට

(02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2013 A/L**

**04.** **X බාල භාණ්ඩයක් වේ නම්, ආදායමෙහි හටගන්නා පහළ වැටීමක් නිසා එම භාණ්ඩයෙහි,**

(1) ඉල්ලුම අඩු වේ. මිල අඩු වේ. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු වේ.

(2) ඉල්ලුම අඩු වේ. මිල වැඩි වේ. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු වේ.

(3) ඉල්ලුම වැඩි වේ. මිල වැඩි වේ. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු වේ.

(4) සැපයුම වැඩි වේ. මිල අඩු වේ. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වේ.

(5) ඉල්ලුම වැඩි වේ. මිල වැඩි වේ. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වේ.

## 2013 A/L

**05.** දොඩම් වෙළෙඳපොළ දැනට සමතුලිතාවේ පවතී යැ, යි සලකන්න. දොඩම් සඳහා ඉල්ලුම වැඩි වෙමින් තිබියදී දොඩම් සැපයුම අඩු වුවහොත් වෙළෙඳපොළ මිල හා ප්‍රමාණය කෙරෙහි ඇති වන බලපෑම පිළිබඳ ව කිව හැක්කේ කුමක් ද?

(1) මිල හා ප්‍රමාණය යන දෙක ම ඉහළ නගී.

(2) මිල ඉහළ නගී. එහෙත් ප්‍රමාණයෙහි වෙනස්වීම නොපැහැදිලි ය.

(3) මිල හා ප්‍රමාණය යන දෙක ම පහළ බසී.

(4) ප්‍රමාණය ඉහළ නගී. එහෙත් මිලෙහි වෙනස් වීම නොපැහැදිලි ය.

(5) ඉල්ලුම් හා සැපයම් වක්‍රවල විතැන්වීම් මගින් එකිනෙකෙහි බලපෑම සටහන් වන බැවින්, මිලෙහි හෝ ප්‍රමාණයෙහි කිසිදු වෙනසක් සිදු නොවේ.

## 2013 A/L

**06. පාරිභෝගික අතිරික්තය ශුන්‍ය අගයක් ගැනීමට අවශ්‍ය කරන කොන්දේසිය වනුයේ**

(1) ඉල්ලුම පූර්ණ මිල නම්‍යතාවෙන් යුක්ත වීම ය.

(2) ඉල්ලුම පූර්ණ මිල අනම්‍යතාවෙන් යුක්ත වීම ය.

(3) සැපයුම පූර්ණ මිල නම්‍යතාවෙන් යුක්ත වීම ය.

(4) සැපයුම පූර්ණ මිල අනම්‍යතාවෙන් යුක්ත වීම ය.

(5) ඉල්ලුමේ මිල නම්‍යතාව සාපේක්ෂ වශයෙන් සැපයුමේ මිල නම්‍යතාවට වඩා ඉහළ අගයක් ගැනීම ය.

## (02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2014 A/L**

**01. කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ඉල්ලුම් සමීකරණය පහත දී ඇත.**

$$Qd = 200 - 8P$$

මෙම භාණ්ඩයේ මිල රු. 10 ක් වන විට මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ වටිනාකම කුමක් ද?

(1) - 6.0 කි.

(2) - 0.66 කි

(3) - 0.06 කි

(4) + 0.06 කි

(5) + 0.66 කි

## 2014 A/L

**02. මිල ඉල්ලුම් නම්‍යතාවෙන් මනිනු ලබන්නේ,**

(1) ඉල්ලුම තීරණය කරන සාධකයක වෙනසට ඉල්ලුම් ප්‍රමාණය දක්වන ප්‍රතිචාරයයි.

(2) භාණ්ඩයක මිලෙහි සාපේක්ෂ වෙනසකට ඉල්ලුම් ප්‍රමාණය දක්වන ප්‍රතිචාරයයි.

(3) යම් භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය වෙනත් භාණ්ඩයක මිලෙහි ඇතිවන වෙනසකට දක්වන ප්‍රතිචාරයයි.

(4) නිෂ්පාදන සාධකයක මිලෙහි ඇතිවන සාපේක්ෂ වෙනසකට ඉල්ලුම් ප්‍රමාණය දක්වන ප්‍රතිචාරයයි.

(5) මිලෙහි සාපේක්ෂ වෙනසකට ඉල්ලුම් ප්‍රමාණයේ ඇතිවන ඉහළ යාමයි.

## 2014 A/L

**03.** සැපයුම්කරුවකු තම භාණ්ඩයේ මිල 10% කින් ඉහළ දැමීම මගින් අයභාරය ඉහළ දමා ගැනීමට බලාපොරොත්තු වේ. මෙම අරමුණ ඉටුකර ගැනීමට නම් වඩාත් යෝග්‍ය වන්නේ,

(1) මිල ඉල්ලුම් නම්‍යතාව එකට වඩා අඩු විය යුතු වීම ය

(2) මිල ඉල්ලුම් නම්‍යතාව එකට වඩා වැඩි විය යුතු වීම ය

(3) මිල ඉල්ලුම් නම්‍යතාව එකට සමාන විය යුතු වීම ය

(4) සැපයුමෙහි මිල නම්‍යතාව ශූන්‍ය විය යුතු වීම ය

(5) සැපයුමෙහි මිල නම්‍යතාව පූර්ණ නම්‍ය විය යුතු වීම ය

(02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2014 A/L**

**04.** අර්තාපල් සහ බී ලූනු වැනි කෘෂිකාර්මික භාණ්ඩවල වෙළෙඳපොළ මිල වසරේ සමහර කාලවල දී ඉහළ මට්ටමකත්, සමහර කාලවල දී පහළ මට්ටමකත් පවතී. එසේ වීමට ප්‍රධාන හේතුව වන්නේ,

(1) අනම්‍ය ඉල්ලුමක් සහ නම්‍ය සැපයුමක් පැවතීමයි.

(2) නම්‍ය ඉල්ලුමක් සහ නම්‍ය සැපයුමක් පැවතීමයි.

(3) අනම්‍ය ඉල්ලුමක් සහ අනම්‍ය සැපයුමක් පැවතීමයි.

(4) නම්‍ය ඉල්ලුමක් සහ අනම්‍ය සැපයුමක් පැවතීමයි.

(5) පූර්ණ නම්‍ය ඉල්ලුමක් සහ පූර්ණ අනම්‍ය සැපයුමක් පැවතීමයි.

(02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2014 A/L**

**05. කිසියම් භාණ්ඩයක ඉල්ලුම් සහ සැපයුම් තොරතුරු පහත වගුවෙන් දැක්වේ.**

| | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) | සැපයුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 80 | 400 | 800 |
| 100 | 200 | 1000 |

ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර සරල රේඛීය යැයි උපකල්පනය කරන්න. මෙම භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය නිවැරදි ව දැක්වෙන පිළිතුර කුමක් ද?

| | මිල (රු.) | ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| (1) | 50 | 500 |
| (2) | 60 | 400 |
| (3) | 60 | 600 |
| (4) | 65 | 300 |
| (5) | 70 | 500 |

**2015 A/L**

**01.** කිසියම් පුද්ගලයෙක් ආදායම ඉහළ යන විට කිරි පිටි සඳහා කරන ඉල්ලුම වැඩි කරයි නම්, කිරි පිටි

(1) බාල භාණ්ඩ උදාහරණයක් වේ.

(2) ආර්ථික නොවන භාණ්ඩයකට උදාහරණයක් වේ.

(3) ගිෆන් භාණ්ඩයකට උදාහරණයක් වේ.

(4) පොදු භාණ්ඩයකට උදාහරණයක් වේ.

(5) සාමාන්‍ය භාණ්ඩයකට උදාහරණයක් වේ.

## (02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2015 A/L**

**02.** යම් දෙන ලද අවස්ථාවක, තරගකාරී වෙළඳපොළක සාමාන්‍ය භාණ්ඩයක් සඳහා ඉල්ලුම වැඩි වී සැපයුම අඩු වුවහොත්,

(1) සමතුලිත මිල පහළ වැටෙන අතර සමතුලිත ප්‍රමාණය ඉහළ නගී.

(2) සමතුලිත මිලත් ප්‍රමාණයත් දෙක ම ඉහළ නගී.

(3) සමතුලිත ප්‍රමාණය ඉහළ නගී. සමතුලිත මිල ඉහළ යාමට හෝ පහළ යාමට පිළිවන.

(4) සමතුලිත මිල පහළ බසී. සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන.

(5) සමතුලිත මිල ඉශළ නගී. සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන.

**2015 A/L**

**03.** බොහෝ පරිභෝජන කටයුතුවල දී සීනි සහ හකුරු එකිනෙකට ආදේශක වශයෙන් සැලැකේ. එබැවින් සීනි මිල ඉහළ ගියහොත්,

(1) හකුරු ඉල්ලුම වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ.

(2) හකුරු ඉල්ලුම අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.

(3) හකුරු ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.

(4) හකුරු මිල අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.

(5) හකුරු ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ.

## 2015 A/L

**04.** පොල් සඳහා මිල ඉල්ලුම් නම්‍යතාවය -1.0 ක් වේ යැයි සලකන්න. එම තත්ත්වය යටතේ පොල් ගෙඩියක මිල රු. 80 ක් වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය පොල් ගෙඩි 500 ක් වේ. ඉල්ලුම් කරනු ලබන පොත් ගෙඩි ප්‍රමාණය 600 ක් වනුයේ පොල් ගෙඩියක මිල කොපමණ වන විට දී ද?

(1) රුපි. 30

(2) රුපි. 40

(3) රුපි. 50

(4) රුපි. 55

(5) රුපි. 60

(02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2015 A/L**

**05. කිසියම් භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් වක්‍රය වමට විතැන් වීමට බලපානුයේ පහත සඳහන් කවර සාධකයක් ද?**

(1) එම භාණ්ඩයේ මිල ඉහළ යාම.

(2) එම භාණ්ඩයේ මිල පහළ වැටීම.

(3) අනුපූරක භාණ්ඩයක මිල ඉහළ යාම.

(4) ආදේශක භාණ්ඩයක මිල ඉහළ යාම

(5) අනාගත මිල පහළ වැටෙතියි යන අපේක්ෂාව.

## 2015 A/L

**06. පහළට බෑවුම් වන වෙළඳපොළ ඉල්ලුම් වක්‍රයක් සහ ඉහළට බෑවුම් වන වෙළඳපොළ සැපයුම් වක්‍රයක් සහිත භාණ්ඩයක යෙදවුම් මිල පහළ වැටීමේ ප්‍රතිඵලයක් වනුයේ,**

(1) සමතුලිත මිල හා ප්‍රමාණය ඉහළ යාම ය.

(2) සමතුලිත මිල හා ප්‍රමාණය පහළ යාම ය.

(3) සැපයුම් වක්‍රය වමට විතැන් වීම ය.

(4) සමතුලිත මිල පහළ වැටීම හා සමතුලිත ප්‍රමාණය ඉහළ යාම ය.

(5) සමතුලිත මිල ඉහළ යාම හා සමතුලිත ප්‍රමාණය පහළ යාම ය.

## 2016 A/L

01. X භාණ්ඩ බාල භාණ්ඩයක් බවත්, තරගකාරී වෙළෙඳ පොළක අලෙවි කරනු ලබන බවත් සලකන්න. ඩ භාණ්ඩය සඳහා ඇති වෙළෙඳ පොළෙහි අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී, ගැනුම්කරුවන්ගේ ආදායමේ පහළ බැසීමක් නිසා වෙළෙඳ පොළ ඉල්ලුම, සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය මත කෙබඳු බලපෑමක් ඇති වේ ද?

| | ඉල්ලුම | මිල | ප්‍රමාණය |
|---|---|---|---|
| (1) | අඩු වේ | අඩු වේ | අඩු වේ |
| (2) | වැඩි වේ | වැඩි වේ | වැඩි වේ |
| (3) | අඩු වේ | වැඩි වේ | අඩු වේ |
| (4) | වැඩි වේ | අඩු වේ | අඩු වේ |
| (5) | අඩු වේ | වැඩි වේ | වැඩි වේ |

(02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2016 A/L**

**02.** බෝල්පොයින්ට් පෑන් සඳහා මිල ඉල්ලුම් නම්‍යතාව -3.0 කි. බෝල්පොයින්ට් පෑනක මිල රුපි. 25 ක් වන විට පෑන් 300 ක් ඉල්ලුම් කරනු ලැබේ. පෑනක මිල රුපි. 20 කට අඩුවුවහොත් කොපමණ ප්‍රමාණයක් ඉල්ලුම් කරනු ලැබේ ද?

(1) 900

(2) 630

(3) 560

(4) 480

(5) 180

**2016 A/L**

**03. කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් හෝ සඳහා වන වෙළෙඳ පොළ සැපයුම් වක්‍රය වමට විතැන් වනුයේ,**

(1) තාක්ෂණය වැඩි දියුණු වන විට දී ය.

(2) යෙදවුම් මිල ගණන් පහළ වැටෙන විට දී ය.

(3) යෙදවුම් මිල ගණන් ඉහළ නගින විට දී ය.

(4) තාක්ෂණය වැඩි දියුණු වන විට හා යෙදවුම් මිල ගණන් පහළ වැටෙන විට දී ය.

(5) කර්මාන්තය තුළට සැපයුම්කරුවන් වැඩි වැඩියෙන් ප්‍රවේශ වන විට දී ය.

## (02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2016 A/L**

**04.** X භාණ්ඩය සඳහා ඇති සැපයුම් වක්‍රය පහත දැක්වෙන සමීකරණයෙන් පෙන්නුම් කෙරේ.

$$Q_x = 6P_x$$

මෙහි $Q_x$ යනු X භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණය වන අතර $P_x$ යනු X භාණ්ඩයේ මිල ය. X භාණ්ඩයේ සැපයුමේ මිල නම්‍යතාව පිළිබඳව මෙම සමීකරණයෙන් නිගමනය කළ හැක්කේ කුමක් ද?

(1) සැපයුමේ මිල නම්‍යතාව 6.0 කි.

(2) සැපයුමේ මිල නම්‍යතාව 1.0 කි.

(3) සැපයුමේ මිල නම්‍යතාව 0.1 කි.

(4) සැපයුමේ මිල නම්‍යතාව 0.0 කි.

(5) සැපයුමේ මිල නම්‍යතාව 0.6 කි.

**2016 A/L**

**05. ආදේශන ප්‍රතිවිපාකය යනු පහත සඳහන් කරුණක ප්‍රතිඵලයක් ලෙස ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ හටගන්නා වෙනස්වීමය. එනම්,**

(1) අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී සාපේක්ෂ මිල වෙනස් වීමකි.

(2) මූර්ත ආදායම නොවෙනස්ව තිබිය දී නිරපේක්ෂ මිල වෙනස් වීමකි.

(3) මුදල් ආදායම නොවෙනස්ව තිබිය දී සාපේක්ෂ මිල වෙනස් වීමකි.

(4) සාපේක්ෂ මිල නොවෙනස්ව තිබිය දී මූර්ත ආදායම වෙනස් වීමකි..

(5) සාපේක්ෂ මිල නොවෙනස්ව තිබිය දී මුදල් ආදායම වෙනස් වීමකි.

(02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2017 A/L**

01. කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළඳපොළ ඉල්ලුම් වක්‍රය නොවෙනස්ව පවතිනුයේ පහත සඳහන් කුමන කරුණක් වෙනසු වූ විට දී ද ?

(1) ජනගහනය

(2) එම භාණ්ඩයේ මිල

(3) ආදේශක භාණ්ඩයක මිල

(4) අනුපූරක භාණ්ඩයක මිල

(5) කුටුම්බවල සාමාන්‍ය ආදායම

(02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

## 2017 A/L

**02. පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයක් සහිත සාමාන්‍ය භාණ්ඩයක් සඳහා ආදායම් හා මිල ඉල්ලුම් නම්‍යතාවන්ගේ පහත සඳහන් කවර සංයෝජනයක් අනුකූල වේ ද ?**

| | ආදායම් ඉල්ලුම් නම්‍යතාව | මිල ඉල්ලුම් නම්‍යතාව |
|---|---|---|
| (1) | සෘණ | ධන |
| (2) | ධන | සෘණ |
| (3) | සෘණ | සෘණ |
| (4) | ධන | ධන |
| (5) | සෘණ | ශූන්‍ය |

(02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2017 A/L**

03. A හා B වශයෙන් භාණ්ඩ දෙකක් පමණක් ඇති බවත්, පාරිභෝගිකයාගේ මුදල් ආදායම ඇතුළු අනෙකුත් සියලු කරුණු නොවෙනස්ව පවතින බවත් සිතන්න. A භාණ්ඩයේ මිල පහළ බසින විට, B භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම වැඩි වේ නම් අපට නිගමනය කළ හැක්කේ,

(1) A සාමාන්‍ය භාණ්ඩයක් බවය

(2) A හා B යන භාණ්ඩ දෙක ම සාමාන්‍ය භාණ්ඩ බවය

(3) A බාල භාණ්ඩයක් බවය

(4) B බාල භාණ්ඩයක් බවය

(5) B සාමාන්‍ය භාණ්ඩයක් බවය

## 2017 A/L

04. සහල් මිල ඉහළ යාමක් නිසා පාන් සඳහා ඉල්ලුම් 30% කින් වැඩි වේ සහල් සහ පාන් අතර හරස් ඉල්ලුම් නම්‍යතාව 3.0 කි මෙම තත්වය ඇතිවීම සඳහා සහල් මිල කොපමණ ප්‍රමාණයකින් වෙනස් විය යුතු ද ?

(1) කිලෝග්‍රෑමයක් රුපියල් 80 සිට රුපියල් 90 දක්වා

(2) කිලෝග්‍රෑමයක් රුපියල් 60 සිට රුපියල් 72 දක්වා

(3) කිලෝග්‍රෑමයක් රුපියල් 80 සිට රුපියල් 85 දක්වා

(4) කිලෝග්‍රෑමයක් රුපියල් 70 සිට රුපියල් 80 දක්වා

(5) කිලෝග්‍රෑමයක් රුපියල් 80 සිට රුපියල් 88 දක්වා

## 2017 A/L

05. කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළඳපොළක පවත්නා මිලේ දී පාරිභෝගිකයන් විසින් මිල දී ගැනීමට කැමති ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් අලෙවි කිරීමට නිෂ්පාදකයන් නිරන්තරයෙන්ම කැමැත්තෙන් සිටී නම් එම වෙළඳපොළ පිළිබඳව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?

(1) ඉල්ලුම ඉතා අනම්‍ය වේ.

(2) සැපයුම ඉතා නම්‍ය වේ.

(3) භාණ්ඩය බාල භාණ්ඩයකි.

(4) භාණ්ඩය සඳහා උපරිම මිලක් නියම කොට තිබේ.

(5) භාණ්ඩය සඳහා අවම මිලක් නියම කොට තිබේ.

**2017 A/L**

**06.** කිසියම් පාරිභෝගික භාණ්ඩයක් සඳහා වන වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සඳහන් සමීකරණවලින් නිරූපනය කෙරේ.

ඉල්ලුම් ( $Q_D$) = 80 - 2P    සැපයුම ($Q_S$) = -20 + 3P

එවිට වෙළඳපොළේ සමතුලිත ප්‍රමාණය සහ මිල වනුයේ,

(1) ඒකක 40 සහ රුපියල් 20 කි.

(2) ඒකක 56 සහ රුපියල් 12 කි.

(3) ඒකක 50 සහ රුපියල් 15 කි.

(4) ඒකක 60 සහ රුපියල් 10 කි.

(5) ඒකක 40 සහ රුපියල් 120 කි.

## 2018 A/L

**01. අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී X භාණ්ඩයේ මිල පහළ බසී නම්, X භාණ්ඩය සඳහා ඇති වෙළඳපොළෙහි සිදුවීමට බොහෝසෙයින් ඉඩකඩ ඇත්තේ පහත සඳහන් කවරක් ද?**

(1) X භාණ්ඩයේ සැපයුම අඩු වන්නේ ය.

(2) X භාණ්ඩය සඳහා ඉල්ලුම වැඩි වන්නේ ය.

(3) X භාණ්ඩය සඳහා ඉල්ලුම අඩු වන්නේ ය.

(4) X භාණ්ඩය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණ්‍ය වැඩි වන්නේ ය.

(5) X භාණ්ඩය සැපයුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වන්නේ ය.

## (02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2018 A/L**

**02. ඉල්ලුම් වක්‍රයක් ඇඳීමේ දී පදනම් කරගනු ලබන උපකල්පනය වන්නේ,**

(1) මිල අඩු වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය සැමවිටම වැඩි වන්නේ ය යන්නය.

(2) මිල අඩු වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය සැමවිටම අඩු වන්නේය යන්න ය.

(3) මිලෙහි හටගන්නා වෙනස්කම්, සැපයුම කෙරෙහි බලපාන්නේ නැතැයි යන්නය.

(4) ඉල්ලුමෙහි මිල නම්‍යතාවය, ඉල්ලුම් වක්‍රය දිගේ වෙනස් නොවේය යන්න ය.

(5) මිල හැර ඉල්ලුම කෙරෙහි බලපාන සාධක ස්ථාවරව පවතීය යන්නය.

(02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2018 A/L**

**03. තේ සඳහා ඉල්ලුමත් සැපයුමත් දෙකම එකවර වැඩි වන්නේ නම්, තේ වෙළඳපොළෙහි සමතුලිත මිල හා ප්‍රමාණය කෙරෙහි එය කෙසේ බලපානු ලැබේ ද?**

| | මිල | ප්‍රමාණය |
|---|---|---|
| (1) | වැඩි වේ | වැඩි වේ |
| (2) | අඩු වේ | අඩු වේ |
| (3) | අඩු වේ | වැඩි වේ |
| (4) | වැඩි වේ | අවිනිශ්චිත ය. |
| (5) | අවිනිශ්චිත ය | වැඩි වේ. |

**2018 A/L**

**04. කිසියම් පුද්ගලයෙකුගේ ආදායම ඉහළ යන විය, කිරි සඳහා ඔහුගේ ඉල්ලුම වැඩි වේ නම් , කිරි උදාහරණයක් ලෙස ගත හැක්කේ,**

(1) බාල භාණ්ඩයකට ය.

(2) නොමිල භාණ්ඩයකට ය.

(3) සාමාන්‍ය භාණ්ඩයකට ය.

(4) ශුභ සාධන භාණ්ඩයකට ය.

(5) ගිෆන් භාණ්ඩයකට ය.

## 2018 A/L

**05. කිසියම් අයතනයක් නිපදවනු ලබන භාණ්ඩයක් සඳහා පූර්ණ අනම්‍ය ඉල්ලුමක් පවතී යැයි උපකල්පනය කරන්න. ආයතනය එම භාණ්ඩයේ මිල 6% කින් ඉහල නංවනු ලැබුවහොත්, ආයතනයේ අයභාරය මත කෙබඳු බලපෑමක් ඇති වේ ද?**

(1) අයභාරය නොවෙනස්ව පවතිනු ඇත.

(2) අයභාරය 6 කින් ඉහළ නගිනු ඇත.

(3) අයභාරය 6 කින් පහළ බසිනු ඇත.

(4) අයභාරය ශුන්‍ය කරා පහළ බසිනු ඇත.

(5) අයභාරය 6 කට වඩා අඩු ප්‍රමාණයකින් ඉහළ නගිනු ඇත.

(02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2018 A/L**

06. 2016 වර්ෂයේ දී තරගකාරී වෙළඳපොළක, කුරුඳු, කිලෝග්‍රෑම් එකක් රුපියල් 900 බැගින් කිලෝග්‍රෑම් මිලියන 10 ක් අලෙවි කරන ලදී. 2017 වර්ෂයේ දී, එම වෙළඳපොළෙහි කිලෝග්‍රෑම් එකක් රුපියල් 800 ක් බැගින් කුරුඳු කිලෝග්‍රෑම් මිලියන 10 ක් අලෙවි කරන ලදී. කුරුඳු ඉල්ලුමේ සැපයුමේ පහත සඳහන් කෙබඳු වෙනස්කම්, මෙම ප්‍රතිඵලය ඇති කිරීමට හේතු වූයේ ද?

| | ඉල්ලුම | සැපයුම |
|---|---|---|
| (1) | වැඩි වීම | වැඩි වීම |
| (2) | අඩු වීම | අඩු වීම |
| (3) | අඩු වීම | වැඩි වීම |
| (4) | වැඩි වීම | අඩු වීම |
| (5) | අඩු වීම | නොවෙනස්ව තිබීම |

## 2018 A/L

**07.** තරගකාරී වෙළඳපොළක අලෙවි කෙරෙන භාණ්ඩයකට අදාළ වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සදහන් සමීකරණයන්ගෙන් නිරූපණය වේ යැයි සලකන්න.

$$Q_D = 160 - 4P \qquad Q_s = -20 + 2P$$

වෙළඳපොළ සමතුලිත වන විට මිල ඉල්ලුම් නම්‍යතාවය,

(1) -2.4 කි.

(2) -2.6 කි.

(3) -2.8 කි

(4) -3.0 කි.

(5) -5.3 කි.

# (02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

## 2019 A/L

**01. X භාණ්ඩයේ මිල වෙනස් වීමක ආදේශන ආදායම් ප්‍රතිවිපාක පහත වගුව පෙන්නුම් කරයි.ආදේශන හා ආදායම් ප්‍රතිවිපාකවල නිවැරදි සංයෝජනය නිරූපණය කරනුයේ පහත සඳහන් කවරක්ද?**

| | X භාණ්ඩයේ ස්වරූපය | මිල වෙනස්වීම | ආදේශන ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය | ආදායම් ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | බාල | පහල යයි | අඩු වේ | වැඩි වේ |
| 02 | බාල | ඉහල යයි | අඩු වේ | අඩු වේ |
| 03 | බාල | ඉහල යයි | වැඩි වේ | වැඩි වේ |
| 04 | සාමාන්‍ය | පහල යයි | වැඩි වේ | වැඩි වේ |
| 05 | සාමාන්‍ය | ඉහල යයි | වැඩි වේ | අඩු වේ |

**2019 A/L**

**02. භාණ්ඩයක සැපයුම් වක්‍රය වමට විතැන් කරනුයේ පහත සඳහන් කවරක්ද?**

(1) නිෂ්පාදන පිරිවැයෙහි ඉහළ යාමක්

(2) නිෂ්පාදන පිරිවැයෙහි පහළ යාමක්

(3) භාණ්ඩයේ මිල ඉහළ යාමක්

(4) භාණ්ඩයේ මිල පහළ යාමක්

(5) ඉල්ලුම අඩු වීමක්

(02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2019 A/L**

**03. කිසියම් පුද්ගලයෙකුගේ ආදායම වැඩි වන විට,පොදු ප්‍රවාහන සේවය සඳහා ඔහුගේ ඉල්ලුම අඩු වන්නේ නම්, පොදු ප්‍රවාහන සේවය උදාහරණයක් වනුයේ,**

(1) බාල භාණ්ඩයකට ය

(2) නොමිල භාණ්ඩයකට ය


(3) ගිෆන් භාණ්ඩයකට ය

(4) සාමාන්‍ය භාණ්ඩයකට ය

(5) පොදු භාණ්ඩයකට ය

## 2019 A/L

**04. X නැමැති භාණ්ඩය සඳහා වන වෙළඳපොල ඉල්ලුම් වක්‍රය පහත රූප සටහන පෙන්නුම් කරයි.**




වෙළඳපොල සමතුලිත ප්‍රමාණය A ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය කරා වෙනස් වීමට බොහෝ දුරට හේතු විය හැක්කේ,

(1) ආදේශක භාණ්ඩයක මිල ඉහළ යාම

(2) පාරිභෝගිකයන්ගේ ආදායම් ඉහළ යාම

(3) පාරිභෝගිකයන්ගේ ආදායම් පහළ යාම

(4) X භාණ්ඩයේ නිෂ්පාදන පිරිවැය පහළ යාම

(5) X භාණ්ඩයේ සැපයුම අඩු වීම ය.

## (02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය


**2019 A/L**

**05.** භාණ්ඩ ඒකකයක් සඳහා රු.100 ක සමතුලිත මිලක් පවතින කල්පිත තරගකාරී වෙළෙඳපොලක් උපකල්පනය කරන්න. දැන් වෙළෙඳපොල සැපයුම් වක්‍රය සෑම මිලකදී ම නම්‍ය තත්ත්වයක සිට. සෑම මිලක දී ම අනම්‍ය තත්ත්වයක් කරා වෙනස්වන බවත්, එහිදී වෙළෙඳපොල සමතුලිත මිල නොවනස්ව පවතින බවත් සලකන්න. මෙම වෙනස පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදන අතිරික්තය මත ඇති කරන ප්‍රතිවිපාක කවරේද ?

| | පාරිභෝගික අතිරික්තය | නිෂ්පාදන අතිරික්තය |
|---|---|---|
| (1) | වැඩි වේ | අඩු වේ |
| (2) | වැඩි වේ | නොවෙනස් වේ |
| (3) | නොවෙනස් වේ | වැඩි වේ |
| (4) | නොවෙනස් වේ | නොවෙනස් වේ |
| (5) | අඩු වේ | වැඩි වේ |

## 2019 A/L

**06.** සාමාන්‍ය භාණ්ඩයක් සඳහා වෙළෙඳපොල ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත රූප සටහන පෙන්නුම් කරයි




වෙළඳපොළ සමතුලිත මිල $P_1$ සිට $P_2$ දක්වා ඉහළ යා හැක්කේ,

(1) පාරිභෝගිකයන්ගේ ආදායම් ඉහළ ගිය විට ය.

(2) අනුපූරක භාණ්ඩයක මිල ඉහළ ගිය විට ය.

(3) නිෂ්පාදන පිරිවැය සැලකිය යුතු ලෙස පහළ වැටුණු විට ය.


(4) නිෂ්පාදන මත ලබාදෙන සහනාධාර ඉහළ ගිය විට ය.

(5) $P_2$ මිල උපරිම මිලක් වශයෙන් නෛතිකව නියම කළ විට ය.

**2019 A/L**

## (02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**07.** පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනයක් එහි සිසුනට අන්තර්ජාල සේවයට ආරම්භයේ දී ගාස්තු අයකිරීමකින් තොරව ලබා දෙනු ලැබුවේ යැයි උපකල්පනය කරන්න.පසුව අන්තර්ජාල සේවාව භාවිත කරන අයගෙන් පැයකට රු 100 ක් බැගින් ගාස්තුවක් අය කිරීමට ආයතනය තීරණය කළ අතර අන්තර්ජාල සේවාව සඳහා සිසුන්ගේ ඉල්ලුම් වක්‍රය පහත රූපසටහන හි දැක්වේ.




ගාස්තු අයකිරීම හඳුන්වා දුන් පසුව අහිමි වූ පාරිභෝගික අතිරික්තයේ වටිනාකම.

(1) රුපියල් 90 000 කි.

(2) රුපියල් 45 000 කි.

(3) රුපියල් 40 000 කි.

(4) රුපියල් 10 000 කි.

(5) රුපියල් 5 000 කි.

(02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2020 A/L**

**01. ඉල්ලුම් නීතිය මගින් ප්‍රකාශ කෙරෙනුයේ,**

(1) භාණ්ඩයක මිළ අඩුවීමක් එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් වක්‍රය වමට විතැන් කරන බව ය.

(2) අනිකුත් කරුණු නොවෙනස් ව තිබියදී කිසියම් භාණ්ඩයක මිල ඉහළ යත්ම, එම භාණ්ඩයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය පහළ යන බව ය.

(3) අනිකුත් කරුණු නොවෙනස් ව තිබියදී කිසියම් භාණ්ඩයක මිල ඉහළ යත්ම, එම භාණ්ඩයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ඉහළ යන බව ය.

(4) භාණ්ඩයක මිල අඩුවීමක් එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් කරන බව ය.

(5) භාණ්ඩයක මිල ඉහළ යාමක් එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් වක්‍රය වමට විතැන් කරන බව ය.

## 2020 A/L

**02. කිසියම් භාණ්ඩයක් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය,**

(1) යම්කිසි මිලක දී පාරිභෝගිකයන් විසින් මිල දී ගැනීමට සැළසුම් කරනු ලබන ප්‍රමාණයයි.

(2) එම භාණ්ඩයේ මිලෙන් සහ පාරිභෝගිකයාගේ ආදායම් මට්ටමෙන් ස්වාධීන වූවකි.

(3) පාරිභෝගිකයින්ගේ මිල දී ගැනීමේ සැළසුම් වලින් ස්වාධීන වූවකි.

(4) සැමවිටම සමතුලිත ප්‍රමාණයට සමාන වේ.

(5) විවිධ මිලයන්හි දී පාරිභෝගිකයන් විසින් මිල දී ගැනීමට කැමති ප්‍රමාණයන් ය.

**2020 A/L**

**03. X භාණ්ඩයෙහි සැපයුම් කරනු ලබන ප්‍රමාණය වැඩිවීමට පහත සඳහන් කවරක් හේතු වේ ද?**

(1) අනිකුත් කරුණු නොවෙනස්ව තිබිය දී X භාණ්ඩයෙහි මිල ඉහළ යාමක්

(2) X භාණ්ඩය නිෂ්පාදන කිරීමේ දී අනුපූරක භාණ්ඩයක් ලෙස ක්‍රියාකරන Y භාණ්ඩයෙහි මිල ඉහළ යාමක්

(3) X භාණ්ඩය නිෂ්පාදනය කිරීමට භාවිතා කෙරෙන තාක්ෂණයේ වැඩිදියුණු වීමක්

(4) X භාණ්ඩය නිෂ්පාදනය කිරීමට භාවිතා කෙරෙන සම්පත්වල මිල පහළ බැසීමක්

(5) X භාණ්ඩය සඳහා වන ආදේශක භාණ්ඩයක ඉල්ලුමෙහි අඩුවීමක්

## 2020 A/L

**04. තරඟකාරී වෙළෙඳපොළක ඉල්ලුම සහ සැපයුම යන දෙකම වැඩි වුවහොත්, සමතුලිත මිල සහ ප්‍රමාණය මත කෙබඳු බලපෑමක් හටගනී ද?**

(1) නිශ්චිත වශයෙන්ම මිල ඉහළ යන නමුදු, ප්‍රමාණය වැඩිවීමට හෝ අඩුවීමට හෝ නොවෙනස් ව තිබීමට හෝ පිළිවන.

(2) නිශ්චිත වශයෙන්ම ප්‍රමාණය ඉහළ යන නමුදු, මිල නැගීමට හෝ පහළ බැසීමට හෝ නොවෙනස් ව තිබීමට හෝ පිළිවන.

(3) නිශ්චිත වශයෙන්ම ප්‍රමාණය පහළ යන නමුදු, මිල නැගීමට හෝ පහළ බැසීමට හෝ නොවෙනස් ව තිබීමට හෝ පිළිවන.

(4) නිශ්චිත වශයෙන්ම මිල පහළ යන නමුදු, ප්‍රමාණය වැඩිවීමට හෝ අඩුවීමට හෝ නොවෙනස් ව තිබීමට හෝ පිළිවන.

(5) නිශ්චිත වශයෙන්ම මිල හා ප්‍රමාණය යන දෙකම ඉහළ නගී.

**2020 A/L**

**05. එක්තරා පාරිභෝගික භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් ශ්‍රිතය $QD = 500 - 5P$ යැයි සලකන්න. රුපියල් 20ත් රුපියල් 30ත් අතර මිල පරාසයේ දී මෙම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුමෙහි චාප මිල නම්‍යතාව කොපමණ වේ ද?**

(1) -0.25

(2) -0.33

(3) -0.43

(4) -0.52

(5) -0.66

**2020 A/L**

06. කිසියම් රටක ජාතික ආපදාවක් පවතින අවස්ථාවක, එරට එළවළු ගොවීහු තම ත්‍යාගශීලීත්වය පෙන්නුම් කරමින් පාරිභෝගිකයන්ට අවශ්‍ය තරම් එළවළු, තරඟකාරී සමතුලිත වෙළෙඳපොළ මිලෙන් හරි අඩකට අලෙවි කිරීමට තීරණය කරති. මෙම ක්‍රියාවේ ප්‍රතිඵලයක් වශයෙන්,

(1) ආර්ථික අතිරික්තය පහළ වැටෙනු ඇත.

(2) ආර්ථික අතිරික්තය ඉහළ නගිනු ඇත.

(3) ආර්ථික අතිරික්තය නොවෙනස්ව පවතිනු ඇත.

(4) පාරිභෝගික අතිරික්තය පහළ වැටෙනු ඇත.

(5) නිෂ්පාදන අතිරික්තය ඉහළ නගිනු ඇත.

**2020 A/L**

**07.** කිසියම් භාණ්ඩයක මිල වෙනස්වීමක ආදායම් ප්‍රතිවිපාකය සෘණ අගයක් ගනු ලැබුවත්, ආදේශන ප්‍රතිවිපාකය වඩා බලවත් වේ නම්, එම භාණ්ඩය

(1) ගිෆන් භාණ්ඩයක් වේ.

(2) සාමාන්‍ය භාණ්ඩයක් වේ.

(3) අත්‍යවශ්‍ය භාණ්ඩයක් වේ.

(4) බාල භාණ්ඩයක් වේ.

(5) සුඛෝපභෝගී භාණ්ඩයක් වේ.

**2020 A/L**

**08.** තරගකාරී වෙළෙඳපොළක අලෙවි කෙරන භාණ්ඩයක් සඳහා වෙළෙඳ පොළ ඉල්ලුම ශ්‍රිතය, QD = 180 – 2P සමීකරණයෙන් දැක්වේ. වෙළඳපොළ සමතුලිත මිල රුපියල් 65ක් වේ නම්, පාරිභෝගික අතිරික්තයෙහි අගය

(1) රුපියල් 625 කි.

(2) රුපියල් 1 000 කි.

(3) රුපියල් 1 250 කි.

(4) රුපියල් 3 250 කි.

(5) රුපියල් 4 500 කි.

**2021 A/L**

**01. සහල් මිල වැඩිවන විට අපේක්ෂා කරනුයේ,**

(1) සහල් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ වැඩි විමකි

(2) සහල් සැපයුම් කරනු ලබන ප්‍රමාණයේ අඩු විමකි

(3) සහල් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ අඩු විමකි

(4) සහල් ඉල්ලුම අඩු විමකි

(5) සහල් සැපයුම වැඩි විමකි

# (02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2021 A/L**

**02.** ඇඟලුම් නිෂ්පාදනයේ ප්‍රධාන යෙදවුමක් වන්නේ රෙදිපිළි බව සලකන්න. අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී, රෙදිපිළි මිල පහළ බසී නම්, එහිදී අපේක්ෂා කරනුයේ,

(1) රෙදිපිළි ඉල්ලුම ඉහළ යාමකි

(2) ඇඟලුම් සැපයුම ඉහළ යාමකි

(3) ඇඟලුම් සැපයුම පහළ යාමකි

(4) ඇඟලුම් ඉල්ලුම ඉහළ යාමකි

(5) ඇඟලුම් ඉල්ලුම පහළ යාමකි

**2021 A/L**

**03. X භාණ්ඩයේ සැපයුම් ශ්‍රිතය, $Q_s = 8P$ සමීකරණයෙන් දැක්වෙන අතර, එහි P භාණ්ඩයේ මිලත් $Q_s$ සැපයුම් කරනු ලබන ප්‍රමාණයත් පෙන්නුම් කරයි. මෙම සමීකරණයට අනුව X භාණ්ඩයේ සැපයුමෙහි මිල නම්‍යතාව,**

(1) 1.0 කි

(2) -1.0 කි

(3) 8.0 කි

(4) -8.0 කි

(5) -8.0 කි answer missing

**2021 A/L**

**04.** අලිගැටපේර සඳහා ඇති වෙළඳපොළ එකවර සිදුවීම් දෙකකට මුහුණ පා ඇතැයි සලකමු. අලිගැටපේර සැපයුමට බලපාන දැඩි නියඟයක් පැවතිය දී පිළිකා රෝග වළක්වා ගැනීමට උපකාරී විය හැකි ඖෂධීය ගුණ අලිගැටපේරවල අඩංගු බව පර්යේෂණයක් මඟින් පෙන්වා දී තිබේ. මෙම සිදුවීම් දෙක අලිගැටපේර වෙළඳපොළෙහි සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය කෙරෙහි කෙසේ බලපානු ලබන්නේද?

| | සමතුලිත මිල | සමතුලිත ප්‍රමාණය |
|---|---|---|
| (1) | වැඩි වේ | අඩු වේ |
| (2) | වැඩි වේ | වැඩි වේ |
| (3) | අඩු වේ | අඩු වේ |
| (4) | වැඩි වේ | අවිනිශ්චිත වේ |
| (5) | අඩු වේ | අවිනිශ්චිත වේ |

## 2021 A/L

**05. X භාණ්ඩය සඳහා ඇති වෙළඳපොළ දැනට සමතුලිතයෙහි පවතී යැයි සලකන්න. X භාණ්ඩයේ සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය යන දෙකම අඩු කිරීමට හේතු නොවන්නේ පහත සඳහන් කවර සිදුවීමක්ද?**

(1) X භාණ්ඩය සඳහා අනුපූරක භාණ්ඩයක් වන Y භාණ්ඩයේ මිල ඉහළ යාම

(2) X භාණ්ඩය සඳහා ආදේශක භාණ්ඩයක් වන Y භාණ්ඩයේ මිල පහළ යාම

(3) X භාණ්ඩය සාමාන්‍ය භාණ්ඩයක් වීම සහ පාරිභෝගික ආදායම් පහළ යාම

(4) X භාණ්ඩය බාල භාණ්ඩයක් වීම සහ පාරිභෝගික ආදායම ඉහළ යාම

(5) X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළෙහි ගැනුම්කරුවන් සංඛ්‍යාව ඉහළ යාම

**2021 A/L**

06. එක්තරා කුඩා නගරයක පලාකොළ සඳහා ඇති දෛනික වෙළඳපොළ ඉල්ලුම හා සැපයුම පහත සඳහන් වගුවේ පෙන්නුම් කරයි.

| කිලෝ ග්‍රෑමයක මිල (රු.) | දෛනික ඉල්ලුම් ප්‍රමාණය (කි.ග්‍රෑ) | දෛනික සැපයුම් ප්‍රමාණය (කි.ග්‍රෑ) |
|---|---|---|
| 60 | 220 | 310 |
| 55 | 240 | 300 |
| 50 | 260 | 290 |
| 45 | 280 | 280 |
| 40 | 300 | 270 |

ප්‍රවාහන වියදම් ඉහළ යාම නිසා පලාකොළ සැපයුම සෑම මිලකදී ම කිලෝ ග්‍රෑම් 60 කින් අඩු වේ යැයි සලකන්න. පලාකොළ සඳහා අලුත් සමතුලිත මිල කොපමණද?

(1) රු. 60 (2) රු. 55 (3) රු. 50 (4) රු. 45 (5) රු. 40

**2021 A/L**

07. භාණ්ඩයක මිල රු. 40 සිට රු. 50 දක්වා ඉහළයාම, එම භාණ්ඩය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ඒකක 1 600 සිට ඒකක 1 400 දක්වා අඩු කිරීමට හේතු වේ යැයි සලකන්න. ඉල්ලුම් වක්‍රයේ මෙම පරාසය තුළ, ඉල්ලුමේ මිල නම්‍යතාව,

(1) -6.0 කි

(2) -3.0 කි

(3) -0.7 කි

(4) -0.6 කි

(5) -0.3 කි

**2022 A/L**

**01. පසුගිය වර්ෂයේ දී ටොන් එකක් රු. 30 000 බැගින් බඩ ඉරිඟු ටොන් මිලියන 15 ක් අලෙවි කළ අතර, මෙම වර්ෂයේ දී බඩඉරිඟු ටොන් මිලියන 15 ක් අලෙවි කරනු ලැබුවේ ටොන් එකක් රු. 25 000 කට ය. මෙම ප්‍රතිඵලයට හේතු විය හැක්කේ ඉල්ලුමේ හා සැපයුමේ පහත සඳහන් කවර වෙනස්වීමක්ද?**

| | ඉල්ලුම | සැපයුම |
|---|---|---|
| (1) | වැඩිවීම | වැඩිවීම |
| (2) | වැඩිවීම | අඩුවීම |
| (3) | අඩුවීම | වැඩිවීම |
| (4) | අඩුවීම | අඩුවීම |
| (5) | වැඩිවීම | වෙනස් නොවීම |

**2022 A/L**

**02.** පාරිභෝගිකයෙකු තම මුළු ආදායම X සහ Y යන භාණ්ඩ දෙක මිල දී ගැනීම සඳහා වැය කරනවා යැයි සලකන්න. අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී පාරිභෝගිකයාගේ ආදායමත් X සහ Y භාණ්ඩවල මිලත් දෙගුණ වුවහොත් මෙම පාරිභෝගිකයා

(1) X සහ Y යන භාණ්ඩවලින් මිල දී ගන්නා ප්‍රමාණ දෙගුණ කරයි

(2) X භාණ්ඩය මිල දී ගන්නා ප්‍රමාණය වැඩිකොට Y භාණ්ඩයෙන් මිල දී ගන්නා ප්‍රමාණය අඩු කරයි

(3) X භාණ්ඩය මිල දී ගන්නා ප්‍රමාණය අඩුකොට Y භාණ්ඩයෙන් මිල දී ගන්නා ප්‍රමාණය වැඩි කරයි

(4) X සහ Y යන භාණ්ඩ දෙකම මිල දී ගන්නා ප්‍රමාණය අඩු කරයි

(5) පෙරදි මිල දී ගත් X සහ Y යන භාණ්ඩ ප්‍රමාණය ම මිල දී ගනී

**2022 A/L**

**03. බාල භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වන්නේ ඇයි ද යන්න පැහැදිලි කිරීමෙහිලා උපකාරී වනුයේ පහත සඳහන් කවරක්ද?**

(1) ආදායම් සහ ආදේශන ප්‍රතිවිපාක විසින් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය එකම දිශාවට රැගෙන යනු ලැබේ

(2) ආදේශන ප්‍රතිවිපාකය ආදායම් ප්‍රතිවිපාකයට සමාන වේ

(3) ඍණ ආදායම් ප්‍රතිවිපාකය විසින් ආදේශන ප්‍රතිවිපාකය අභිබවා යනු ලැබේ

(4) ආදේශන ප්‍රතිවිපාකය විසින් ඍණ ආදායම් ප්‍රතිවිපාකය අභිබවා යනු ලැබේ

(5) ආදායම ඉහළ යාමක් සමඟ පාරිභෝගිකයා විසින් භාණ්ඩය පරිභෝජනය කිරීම වැඩි කරනු ලැබේ

**2022 A/L**


**04.** X සහ Y භාණ්ඩ අනුපූරක භාණ්ඩ බව සලකන්න. අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී Y භාණ්ඩයේ සැපයුම වැඩිවීමක් නිසා X භාණ්ඩයේ සමතුලිත මිල සහ ප්‍රමාණය මත කවර බලපෑමක් ඇති කෙරේද?

| | X භාණ්ඩයේ සමතුලිත මිල | X භාණ්ඩයේ සමතුලිත ප්‍රමාණය |
|---|---|---|
| (1) | අඩු වේ | අඩු වේ |
| (2) | අඩු වේ | වැඩි වේ |
| (3) | වැඩි වේ | අඩු වේ |
| (4) | වැඩි වේ | වැඩි වේ |
| (5) | අඩු වේ | නොවෙනස් වේ |

## (02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2022 A/L**

**05.**




එක්තරා භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පහත රූපසටහනෙහි දැක්වේ. ඉහත රූපසටහනෙහි දැක්වෙන ඉල්ලුම් වක්‍රය රු. 8 සහ රු. 10 අතර මිලයන්හි දී,

(1) පූර්ණ නම්‍ය වේ

(2) සාපේක්ෂව නම්‍ය වේ

(3) සාපේක්ෂව අනම්‍ය වේ

(4) ඒකීය නම්‍ය වේ

(5) පූර්ණ අනම්‍ය වේ

## 2022 A/L

**06.** තරඟකාරී වෙළෙඳපොළක අලෙවිකරන එක්තරා භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත දැක්වෙන සමීකරණ මගින් නිරූපණය කෙරේ. මිල රුපියල්වලින් දැක්වේ.

$$Q_D = 40 - 2P \qquad Q_s = -40 + 8P$$

වෙළෙඳපොළ සමතුලිතයේ දී සමස්ත අතිරික්තය,

(1) 36 කි.

(2) 144 කි.

(3) 180 කි

(4) 192 කි.

(5) 360 කි.

**2022 A/L**

**07. සහල් සහ පාන් අතර ඉල්ලුමේ හරස් මිල නම්‍යතාව 30 ක් වේ යැයි සලකන්න. සහල් මිල ඉහළ යාමක් නිසා පාන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය 75% කින් වැඩි විය. සහල් මිලයන්හි කවර වෙනසක් මේ සඳහා හේතු වුයේ ද?**

| | සහල් කිලෝග්‍රෑමයක මිල වෙනස් වීම (රු) | |
|---|---|---|
| | සිට | දක්වා |
| (1) | 50 | 70 |
| (2) | 60 | 72 |
| (3) | 75 | 90 |
| (4) | 80 | 105 |
| (5) | 100 | 125 |

(02) ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළඳපොළ සමතුලිතය

**2023 A/L**

**01. පහත සඳහන් දෑ අතුරින් ඉල්ලුම් තිරයක් නොවන්නේ කවරක් ද?**

(1) ආදේශක භාණ්ඩයක මිල

(2) ලබන මාසයේ දී අදාළ භාණ්ඩයේ අපේක්ෂිත මිල

(3) අනුපූරක භාණ්ඩයක මිල

(4) අදාළ භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගැනෙන යෙදවුමක මිල

(5) පාරිභෝගිකයන්ගේ ආදායම් ය

**2023 A/L**

**02.** තරඟකාරී වෙළෙඳපොළක දොඩම් සඳහා ඇති ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර වලට අදාළ සමීකරණ පිළිවෙළින් පහත දැක්වේ.

$$Q_D = 600 - 5P \qquad\qquad Q_s = 240 + 3P$$

මෙම වෙළෙඳපොළෙහි දොඩම් ගෙඩියක මිල රු. 100ක් ලෙස නියම කරනු ලැබුවහොත්,

(1) ඒකක 40ක අධි ඉල්ලුමක් හටගනී

(2) ඒකක 40ක අධි සැපයුමක් හටගනී

(3) ඒකක 350ක අධි ඉල්ලුමක් හටගනී

(4) ඒකක 350ක අධි සැපයුමක් හටගනී

(5) සමතුලිත මිල සහ ප්‍රමාණය නොවෙනස් ව පවතී

**2023 A/L**

**03. ඉල්ලුමත් සැපයුමයත් දෙකම එකවර වැඩි වුවහොත් එවිට,**

(1) සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය ඉහළ යනු ඇත.

(2) සමතුලිත මිල සහ පහළ වැටෙන නමුදු සමතුලිත ප්‍රමාණය ඉහළ යනු ඇත.

(3) සමතුලිත මිල ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන, එහෙත් සමතුලිත ප්‍රමාණය ඉහළ යනු ඇත.

(4) සමතුලිත මිල ඉහළ යන නමුදු සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන.

(5) සමතුලිත මිල පහළ වැටෙන අතර සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන.

## 2023 A/L

**04. දී ඇති රූප සටහනෙහි සැපයුම් වක්‍ර දෙක එකිනෙකට සමාන්තර වේ. රු. 30 සහ රු. 40 අතර මිල පරාසයේ දී**

(1) සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය ඉහළ යනු ඇත.

(2) සමතුලිත මිල සහ පහළ වැටෙන නමුදු සමතුලිත ප්‍රමාණය ඉහළ යනු ඇත.

(3) සමතුලිත මිල ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන, එහෙත් සමතුලිත ප්‍රමාණය ඉහළ යනු ඇත.

(4) සමතුලිත මිල ඉහළ යන නමුදු සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන.

(5) සමතුලිත මිල පහළ වැටෙන අතර සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන.